Berghof
Research Center
Forschungszentrum
for Constructive
für konstruktive
Conflict Management
Konfliktbearbeitung

# සන්නද්ධ ගැටුමක ප්‍රවණතා සහ හේතු

ඩැන් ස්මිත් (Dan Smith)

www.berghof-handbook.net



1. හැඳින්වීම 142
2. 1990 ගණන්වල සන්නද්ධ ගැටුම 143
3. ගැටුම් හේතු පිළිබඳ න්‍යායයෝ 146
4. පසුබිම් හේතු සහ අභිමුඛ සාධක 149
5. ක්‍රමවේදය සහ ප්‍රවර්ගීකරණය 151
6. අසාධාරණය සහ සජ්ජිත කිරීම 152
7. ජනවාර්ගිකත්වය සහ ගැටුම 153
8. නිගමනය 159
9. ආශ්‍රිත ලේඛන සහ වැඩිදුර කියවීම් 159

©2006 Berghof Research Center for Constructive Conflict **Management**

# සන්නද්ධ ගැටුමක ප්‍රවණතා සහ හේතු

ඩෑන් ස්මිත් (Dan Smith)

## 1. හැඳින්වීම

මහා රාජ්‍යයන් දෙකක් සහ උප-රාජ්‍ය කලාප 80ක් සම්බන්ධ කර ගනිමින් ද, හැට ලක්ෂයක් පමණ දෙනකුට මරු කැඳවමින් ද, 1990 ආරම්භයේ සිට 1999 අවසානය දක්වා කාලය තුළ ලොව පුරා සන්නද්ධ ගැටුම් 118ක් සිදු වී ඇත. ගැටුම් සන්නද්ධ යුද්ධ බවට වර්ධනය වීම වළක්වන්නට අප අදහස් කරන්නේ නම්, එය නොකළ හැකි විට අඩු තරමින් හැකි ඉක්මනින් සටන් නතර කිරීමටවත් අදහස් කරන්නේ නම්, එසේ ම විද්‍යමාන විසඳුමෙන් පසු යළි යුද්ධයට යාම වැළැක්වීමේ අවස්ථාව උපරිම කරන්නට අපට අවශ්‍ය නම්, සන්නද්ධ ගැටුම් සහ ඒවාට පාදක වන හේතු අප හොඳින් අවබෝධ කර ගත් බවට මුලින් සහතික කර ගත යුතු වේ.

මෙම පරිච්ඡේදයෙන් සන්නද්ධ ගැටුම්වලට පාදක වූ හේතු සම්බන්ධයෙන් අප දන්නා සහ අවබෝධ කර ගත් දෑ පිළිබඳව කෙටි රූප රේඛාවක් සපයන්නට වෑයම් කෙරෙයි. එම අවබෝධයේ න්‍යායාත්මක පදනම සීමාසහිත නමුත් වැදගත් ය. සන්නද්ධ ගැටුම් නම් වූ ප්‍රපංචය පිළිබඳව පොදු පැහැදිලි කිරීමක් වශයෙන් එතරම් දෙයක් අපට ලබා නොදෙන හෙයින් එය සීමා සහිත ය; එහි සංකීර්ණභාවය සහ විවිධත්වය අනුව මෙය පුදුමයක් නොවේ. ඒ ඒ ගැටුම් වර්ධනය වීමේ ලක්ෂණ විශ්ලේෂණය කිරීමේදීත්, ඒවා ප්‍රචණ්ඩ ලෙස වර්ධනය වීම වැළැක්වීමට අවස්ථාවන් සොයන විටදීත්, යා යුතු මග පිළිබඳ වැදගත් මාර්ගෝපදේශ සපයන හෙයින් එය වැදගත් ය. වත්මන් න්‍යායාත්මක දැනුමේ සීමාසහිත බව අනුව සහ ප්‍රායෝගික දැනුම වර්ධනය කර ව්‍යාප්ත කිරීමට සහාය වීම පිළිබඳ වෙළුමේ අරමුණු අනුව බලන විට මෙම ලිපියේ න්‍යායාත්මක සාකච්ඡාව සාපේක්ෂ වශයෙන් කෙටි ය. කෙසේ වෙතත් මෙහි දී අවධාරණය කෙරෙන්නේ න්‍යායය පිළිබඳව නොව, සන්නද්ධ ගැටුම් අධ්‍යයනය කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේ ව්‍යවහාරික ක්‍රමවේදය පිළිබඳව ය.

1990 ගණන්වල සන්නද්ධ ගැටුම් අවස්ථා සහ ඒවායේ ස්වභාවය සාකච්ඡා කිරීමෙන් මෙම පරිච්ඡේදය ආරම්භ වේ. විධික්‍රමය වෙත පියනගන්නට පෙර, රූප රේඛාවක් පමණක් නොව, වැඩිදුර තොරතුරු මූලයක් සැපයීමෙන්, අනතුරුව, න්‍යායාත්මක දැනුමේ වත්මන් තත්ත්වය විග්‍රහ කෙරේ. මෙහි ප්‍රධාන කාරණයක් වන්නේ සන්නද්ධ ගැටුම්වලට හේතු රාශියක් තිබීම පමණක් නොව විවිධ ස්වරූප ගන්නා හේතු තිබීමයි. මෙය පෙරළා විවිධ වර්ගයේ සහ මට්ටම්වල න්‍යායයන් සහ විශ්ලේෂණ අපේක්ෂා කරයි. මේ හේතුව නිසා, ක්‍රමවේදී කාරණා එක්තරා දුරකට ප්‍රාථමික ද වේ. ඒවා අදාළ වන්නේ න්‍යාය සහ දත්ත සංවිධානයට ය. කෙටිකාලීන දෑ දීර්ඝකාලීන දෑ සමඟ බද්ධ කිරීම සඳහාත් සමාජ-ආර්ථික පසුබිම දේශපාලන පසුබිම සමඟ සම්බන්ධ කිරීම සඳහාත් හේතුන්ගේ විවිධ ප්‍රවර්ග සහ මට්ටම් බද්ධ කිරීමේ හොඳම ක්‍රමය වශයෙන් මෙහි දී යුක්තිය හා සජ්ජිත කිරීම (mobilization) පිළිබඳ යුගල සංකල්ප හඳුන්වා දෙයි. එය වාර්ගික ගැටුම් ලෙස හැඳින්වෙන ප්‍රභේදය දෙස වඩා සමීපව බලා මෙය විස්තර කරයි.

## 2. 1990 ගණන්වල සන්නද්ධ ගැටුම

මේ පරිච්ජේදයේ අවි ගැටුම් සම්බන්ධ දත්ත ඉදිරියට ගෙනන අතර, The State of War and Peace (ස්මිත් 1997) කෘතියේ එන නිර්වචන හා දත්ත නියම භාවිතා කරයි. උප්සලා විශ්ව විද්‍යාලයේ සාම හා ගැටුම් පර්යේෂණ අංශය මගින් සම්පාදනය කොට Peace Research සඟරාවේ ඇතුළත් වේ (වෙලෙන්ස්ටීන් සහ සොලෙන්බර්ග්, 1996, 1997, 1998, 1999 සහ 2000 බලන්න). එන දත්ත හා සසඳන මෙම දත්ත ද බෙහෙවින් සමාන නමුත් විස්තර වශයෙන් සැහෙන තරමින් වෙනස් වෙයි. දත්ත ගොනු දෙකම සාමාන්‍යයෙන් වාර්ෂික යුද්ධ මරණ 25 ක් අන්තර්ගත කරන නමුත් මා සිය ගණනක් යුද්ධ මරණ ඇතුළත් කරන්නේ ප්‍රවේශ වශයෙන් ඇති සීමිත සංඛාවක් පවතින දත්ත නියෝජනය නොකරන බැවිනි. උප්සලා කණ්ඩායම දක්වන පරිදි නිර්වචනය සඳහා එක් පාර්ශවයක් වෙනුවෙන් හෝ පිළිගත් රාජ්‍යයක් සම්බන්ධ විය යුතුය යන මතය මම අනුගමනය නොකරමි. ආණ්ඩු බලය සහ භෞමික බලය පිළිබඳ ආරවුල්වල දී, සටන් අතර අඛණ්ඩ බවක් සහිතව, කේන්ද්‍රීය වශයෙන් සංවිධිත පාර්ශ්වයන් දෙකක් හෝ වැඩි ගණනක් අතර සිදුවන විවෘත හා සන්නද්ධ සටන්, සන්නද්ධ ගැටුම් ලෙස අර්ථ නිරූපණය කෙරේ. 1990 සිට 1999 දක්වා සිදු වුණු සන්නද්ධ ගැටුම් 118න් දහයක් තිර ලෙස අන්තර්-රාජ්‍ය ගැටුම් ලෙස අර්ථ නිරූපණය කළ හැකි ය. ප්‍රවෘත්ති සිරස්තල ආකර්ෂණය කර ගන්නේත් සමකාලීන යුද්ධ කෙරෙන ආකාරය පිළිබඳ බහුජන දෘෂ්ටිය හැඩ ගස්වා ගන්නේත් මෙම ගැටුම් වුවත්, ඒවා සාපේක්ෂ වශයෙන් සමස්ත යුද්ධයෙන් සාපේක්ෂ කුඩා ප්‍රතිශතයක් පමණි. බොහෝ යුද්ධවල නිරත කැරලිකරුවන් තමන්ගේ ගැටුම් නිදහස් අරගල ලෙස අර්ථ නිරූපණය කළත් ඉහත කී ගැටුම්වලින් පහක් පමණක් තිර ලෙස ම නිදහස් අරගල ලෙස හැඳින්විය හැකි ය. යුද්ධ සියයක් බොහෝ දුරට, මූලික වශයෙන් හෝ විශේෂිත වශයෙන් අභ්‍යන්තර ගැටුම් වෙයි. එවැනි ලිහිල් පාරිභාෂිකයන් යොදා ගැනීම, බොහෝ යුද්ධ නිරවුල් වර්ගීකරණයකට යටත් නොවන අයුරු පෙන්වන දර්ශනයක් වෙයි. උදහරණයක් වශයෙන් 1999 දී හා 2000 දී සලකා බලන ලද යුද්ධ සියයට ඇතුළත් නොකෙරුණු යුද්ධ දෙකක් සෑම ආකාරයකින් ම හා මුළුමනින් ම ඉතියෝපියාවේ අභ්‍යන්තර සංසිද්ධීන් වූ නමුත් එම යුද්ධ දෙකට අදාළ ගැටුම් බොහෝ ගණනක් සිදු වූයේ යාබද සෝමාලියාවේදී ය. ප්‍රජාතන්ත්‍රවාදී කොංගෝ ජනරජයේ (කලින් සයරේ) 1998 සිට 2000 දක්වා කෙරීගෙන ගිය යුද්ධය අන්තර්-ජාතික යුද්ධයක් ලෙස බොහෝ දුරට සැලකිය හැකි එයටම විශේෂිත වර්ගයකට අයත් වූවකි. එක්තරා දුරකට එය ජනාධිපති ලෝරන්ට් කබීලා බලයේ සිටිය යුතුදැයි තීරණය කිරීම සඳහා කෙරුණු සිවිල් යුද්ධයක් වූ අතර එක්තරා දුරකට කලාපීය බලය සහ බලපෑම සඳහා වූ ජාත්‍යන්තර යුද්ධයකි. ඇන්ගෝලාව, චැඩ්, නැමීබියාව, සූඩානය සහ සිම්බාබ්වේ යන රටවල් ජනාධිපති කබීලාගේ හමුදා සමඟ මිතුරුව කටයුතු කළ අතර, රුවන්ඩාව සහ උගන්ඩාව එම රටවලට එරෙහිව සටන් කොට 2000 දී ඔවුනොවුන්ට එරෙහිව ද සටන් කළහ.

## වගුව 01 : සන්නද්ධ ගැටුම 1990 - 1999

| කලාපය | 1990 | 1991 | 1992 | 1993 | 1994 | 1995 | 1996 | 1997 | 1998 | 1999 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආසියා ශාන්තිකර | 21 | 21 | 25 | 24 | 23 | 21 | 22 | 14 | 19 | 20 |
| මධ්‍යම සහ දකුණු ඇමෙරිකාව | 7 | 6 | 5 | 3 | 4 | 5 | 4 | 2 | 3 | 2 |
| උතුරු අප්‍රිකාව සහ මැද පෙරදිග | 7 | 8 | 8 | 9 | 9 | 9 | 8 | 8 | 6 | 4 |
| සහරාව ආශ්‍රිත අප්‍රිකාව | 17 | 22 | 18 | 18 | 23 | 21 | 18 | 19 | 18 | 16 |
| යුරෝපය | 4 | 10 | 12 | 8 | 6 | 4 | 2 | 3 | 3 | 5 |
| එකතුව | 56 | 67 | 68 | 62 | 65 | 60 | 54 | 57 | 49 | 47 |

01 වගුවේ පෙන්නුම් කරන පරිදි 90 දශකයේ මුල භාගයේදී ලෝකයේ වාර්ෂික දළ සන්නද්ධ ගැටුම් සංඛ්‍යාව තියුණු ලෙස 1990 වසරේදී 56 සිට (1983 දී එය 47 ක් විය) 1992 වන විට 68 දක්වා ඉහළ ගොස් ඇත. මේ කාලය තුළ සීතල යුද්ධය නිමවීමෙන් ලොව ඇති වූ සුභවාදී බව, නව ආකාරයක සන්නද්ධ ගැටුම් රැල්ලක් ඇරඹීමත් සමග අසුභවාදී බවට පෙරළිණි. ඒ කෙසේ වුවත් සෑම වසරකම සන්නද්ධ ගැටුම්වල ස්ථාවර වීමක් මෙන්ම අඩුවීමක් ද පෙන්නුම් කෙරේ. ඒ අනුව 1990-1999 කාල පරිච්ඡේදයේ ඇති වූ මුළු යුද්ධ 118 ක ප්‍රමාණය මූලික සිවිල් යුද්ධ 100ක කින් ද, ප්‍රධාන වශයෙන් වූ සිවිල් යුද්ධ දෙකකින් ද, නිදහස් අරගල පහකින් ද, අන්තර්-රාජ්‍ය යුද්ධ 10 කින් ද, අන්තර්-ජාතික යුද්ධයකින් ද සැදුම් ලද්දේ ය.

යුරෝපයේ ඇති වූ නව ප්‍රචණ්ඩ ගැටුම් (රුසියාව, තුර්කිය සහ කොකේසස් ඇතුළුව) 1990 ගණන්වල මුල දී වාර්ෂිකව ඇති වූ යුද්ධවල වර්ධනයෙන් තුනෙන් දෙකකට හේතු විය. ඒ කාලයේ දී ඒ කලාපය ඉක්මනින් ම ලෝකයේ වඩාත් ප්‍රචණ්ඩ කලාපයක් බවට පත්විය. එසේ ම 1992 න් පසු, විශේෂයෙන් ම 1997 සහ 1998 ගැටුම් සංඛ්‍යාව විශාල වශයෙන් පහත වැටෙන තෙක් වාර්ෂික සන්නද්ධ ගැටුම් සංඛ්‍යාව අඩු වීම ප්‍රධාන වශයෙන් ම යුරෝපයේ ඇති වූ වෙනස්කම් නිසා සිදු විය. යුරෝපයේ ප්‍රචණ්ඩ ගැටුම්වල වර්ධනය, යුගෝස්ලෝවියාව හා සෝවියට් සමූහාණ්ඩු සංගමය කැඩී විසිරී යාමේ ක්‍රියාවලිය නමැති සන්දර්භය තුළ ප්‍රධාන වශයෙන් ම කේන්ද්‍රගත වූයේ බෝල්කන් ප්‍රදේශයේ සහ කොකෙසස් ප්‍රදේශයේ ය. ඒ දිනවල බොහෝ විස්තර විචාරකයින් තැති ගෙන සිටි ආකාරයෙන් 1990 ගණන්වල මුල දී යුරෝපයේ යුද්ධ පැතිරීම මඟින් මහාද්වීපයේ නව සන්නද්ධ ගැටුම් යුගයක් බිහිවීම සිදු වූයේ නැත. එම ගැටුම් යුගෝස්ලෝවියාවේ සහ සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයේ බල පද්ධති බිඳවැටීමෙන් අනතුරුව කෙරුණු සමාජ, ආර්ථික හා දේශපාලන නව හැඩ ගැන්වීම්වල ප්‍රචණ්ඩ සහ ඛේදනීය ලක්ෂණයි. එම සංකීර්ණ නව හැඩ ගැස්වීම්වල ප්‍රතිඵල ජාතික සහ ජාත්‍යන්තර මට්ටම්වල දී සංකේන්ද්‍රණය වත් ම, වාසනාවට මෙන් ඒවායේ ප්‍රතිවිපාක අඩු ප්‍රවේගයක් සහ අඩු ප්‍රචණ්ඩත්වයක් ගෙන ඇත.

එසේ වුව ද මෙම නිගමනය මඟින් ගෙන දෙන ලද සුභවාදී බව තවත් කරුණු දෙකක් මඟින් දුබල කෙරේ. ඉන් පළමු වැන්න නම්, ලෝක මට්ටමෙන් පැරණි ගැටුම් බොහෝ දුරට තවමත්

පැවතීමයි. 1999 පැවැති සන්නද්ධ ගැටුම්වලින් සියයට හැට හයක් වසර පහකට වඩා පැරණි ය. ඉන් සියයට තිහක් විසි වසරකට වඩා පැවතී ඇත. මෙම දිග්ගැස්සුණු සන්නද්ධ ගැටුම්වල අවසානයක් දැකීම අතිශයින් ම දුෂ්කර බව ඔප්පු වී ඇත. එහෙයින් ලෝකය නියත වශයෙන් ම, නව සහ වඩාත් සාමකාමී යුගයකට ප්‍රවිෂ්ට නොවේ. දෙවනුව, 1980 ගණන්වල අවසාන භාගයේ හෝ 1990 ගණන්වල මුල් භාගයේ ආරම්භ වී දැනට අක්‍රීය වී ඇති යුරෝපයේ බොහෝ සන්නද්ධ ගැටුම් සැබවින් ම අවසන් වී නැත; ඒවා අත්හිටවනු ලැබ ඇත.

"අවසන් කෙරිණි" යන්නෙහි සහ "අත්හිටුවන ලදී" යන්නෙහි වෙනස වත්මන් සන්නද්ධ ගැටුම් පිළිබඳ ප්‍රශ්නය අවබෝධ කර ගැනීමේ දී අතිශයින් ම වැදගත් ය. සටන් විරාම ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු පමණක් නොව සාම ගිවිසුම්වලට එළැඹීමෙන් පසු පවා නැවත ඇති වන යුද්ධ මඟින් ජාත්‍යන්තර දේශපාලන දර්ශන තලය විකෘත වේ. පසුගිය දශකයේ දී පමණක් සටන් විරාම හෝ පැහැදිලි සාම ගිවිසුම්වලින් අනතුරුව යළි ආරම්භ කෙරුණු යුද්ධ අතර ඇංගෝලාව, බුරුණ්ඩි, කාම්බෝජය, චෙච්නියාව, ක්‍රොඒෂියාව, කොංගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, එරිට්‍රියාව, ඉතියෝපියාව, කොසෝවෝ, ලයිබීරියාව, පිලිපීනය, රුවණ්ඩාව, සියරා ලියෝන් සහ ශ්‍රී ලංකාව යන රටවල යුද්ධ ගණන් ගත හැකි ය. සෑම විටම යුද්ධ නැවත ඇතිවෙන්නේ පෙරට වඩා වැඩි දරුණු බවකින් හා විනාශකාරී බවකින් යුක්තව මෙන්ම විශේෂයෙන් ම සිවිල් ජනතාවට විශාල හානි සිදුවන ආකාරයට ය.

යුද්ධ යළි ඇති වීමට විවිධ හේතු රැසක් ඇතඃ සිරස්තල හතරක් යටතේ මේවා කාණ්ඩගත කළ හැකිය. එක් පාර්ශවයක හෝ පාර්ශවයන් දෙකේ ම හෝ හුදු වංකභාවය පළමු වැන්නයි (සියරා ලියෝන් හි විප්ලවකාරී එක්සත් පෙරමුණ (ආර්.යු.එෆ්.) නිදසුනකි. කිසිම ගිවිසුමක් පිළිපැදීම සම්බන්ධයෙන් එම සංවිධානය කෙරේ විශ්වාසය තැබිය නොහැකි ය). දෙවැනි හේතුව වන්නේ එක් පාර්ශවයක හෝ පාර්ශව දෙකේ ම බලාපොරොත්තු කඩවීමයි. පිටත සිට බලන විට මෙය වංකභාවයට සමාන දෙයක් ලෙස පෙනී යා හැකි ය. එක් පාර්ශ්වයක් කොන්දේසි සහිතව පමණක් සාම ගිවිසුම් පිළිගත් අවස්ථා බහුල නමුත්, එම කොන්දේසිය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කෙරෙන්නේ හෝ ගිවිසුමේ කොටසක් වන්නේ නැත. සමහර අවස්ථාවලදී යුද්ධයෙන් පසු පැවැත්වෙන මැතිවරණයෙන් ජයගැනීමට එක් පාර්ශ්වයක් දැඩි බලාපොරොත්තුවක් ඇතිව සිටින අතර, එම පාර්ශවය සාම ගිවිසුමට අත්සන් කිරීමට එකඟ වන්නේ ඒ හේතුව නිසා පමණි. ඒ බලාපොරොත්තුව ඉටු නොවූ විට ඔවුහු යළි යුද්ධය වෙත පිය නගති. ඇංගෝලාවේ යුනිටා ඊට නිදර්ශනයකි.

තුන්වැනි කාරණය වන්නේ අභ්‍යන්තර ගැටලු මතුවීමෙන් එක් පාර්ශ්වයක හෝ පාර්ශ්ව දෙකම දෙදරා යාම ය. මෙය ද වංකභාවය ලෙස පෙනී යා හැකිය. සාම ගිවිසුම් සෑම විට ම එක් එක් පාර්ශවය තුළ ඇති නොසන්සුන්තා සහ ආරවුල් මතුපිටට ගෙන එයි. යුද්ධයේ නාමයෙන් පවත්වාගෙන එන ලද සමගිය සාමය පැමිණි විට ඉක්මනින් ම දෙදරා යා හැකි ය.

සැබවින් ම, ගැටුමේ එක් පැත්තක සිටින සන්ධානයේ කොටසකගේ දීර්ඝ කාලීන අරමුණු ඉටුකර ගැනීමේ බලාපොරොත්තු කඩ කරමින් සාමය ළඟාවීම ඔවුනට තර්ජනයක් ලෙස පෙනී යා හැකිය. උතුරු අයර්ලන්තයේ අයි. ආර්. ඒ. සංවිධානයෙන් කැඩී ගිය කුඩා කණ්ඩායම් ගැන සලකා

බලන්නේ එසේ නැතිනම්, ඊශ්‍රායලයේ සහ පලස්තීනුවන් අතර සිටින සටන්කාමීන් විසින් ඊශ්‍රායෙල - පලස්තීන සාම ක්‍රියාවලිය ප්‍රතික්ෂේප කිරීම මීට උදාහරණයි.

යුද්ධය යළි ඇති වීමට හේතුවන සිව්වැනි කාරණය වන්නේ සන්නද්ධ ගැටුම ඇති වීමට යටි හේතු තවදුරටත් පැවතීමයි. ගැටුමට බලපෑ දිගුකාලීන හේතුන්ට පිළියම් නොයෙදීම, විසඳුමක් සඳහා වන සියලු උත්සාහයන් හුදු අලංකාරය සඳහා කෙරෙන කටයුතු බවට පත් කරනු ඇත. බොස්නියා හර්සගොවිනාවේ යුද්ධය අවසන් කිරීම සඳහා වූ ඩේටන් ගිවිසුමෙන් පස් වසරකට පසු ජාත්‍යන්තර සන්නද්ධ සාම සාධක හමුදාව ආපසු හරවා යැවුවහොත්, වහාම යුද්ධය යළි ඇවිළ යාමේ අනතුරක් බොහෝ නිරීක්ෂකයෝ නිරතුරු ව දකිති.

ඉහතින් කෙටියෙන් සටහන් කොට ඇති පරිදි, දිග්ගැස්සුණු ගැටුම් හා සමකාලීන යුද්ධයේ පොදු ප්‍රධාන ලක්ෂණය වන්නේ සාම ගිවිසුම්වල මූලික අස්ථාවරභාවයයි; කැරැලිකාර හමුදාවල සාපේක්ෂ දුබලභාවය ද සමකාලීන යුද ගැටුම් වසර ගණනාවක් පැවතීමට දෙවැනි හේතුව ලෙස ටාබර් (1970, පිට 45) ගෙන හැර දක්වයි. පහර දෙන්නේ කොහි ද, කෙසේ ද, යන්න තීරණය කරමින් ගරිල්ලන්ට ප්‍රහාරයක වේගය හා දරුණු බව පාලනය කළ හැකිය. ප්‍රධාන ඉලක්ක සොයාගෙන මූලින් පහර දීමට රජයේ හමුදාවන්ට හැකියාව සහ කැමැත්තක් නැත්නම් ප්‍රතිඵලය වන්නේ දිගුකාලීන, සීමිත යුද්ධයකි; විටින් විට මතුවන විනාශකාරී  ගැටුමකි.



යුද කලාප නිතර ම රටේ එක් කොටසකට සීමා වන්නේ මේ නිසා ය. වාර්තාකරුවන්ට, දේශපාලනඥයින්ට, පර්යේෂකයින්ට, ව්‍යාපාරිකයින්ට, රාජ්‍යතාන්ත්‍රිකයින්ට, ලෝක බැංකු විශේෂඥයින්ට සහ පිටින් එන අනෙක් අයට යුද්ධයක් කෙරෙන රටක අගනුවරට යා හැකි මෙන් ම යුද්ධයක් කෙරෙන බවක් නොදැන සිටීමට ද හැකි ය. මක්නිසා ද යත්, බොහෝ සන්නද්ධ ගැටුම් ප්‍රාදේශීයකරණය වී වසර ගණනාවක් තිස්සේ සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමෙන් කෙරීගෙන යන හෙයිනි.  ඒවා ජාත්‍යන්තර මාධ්‍යයට ආකර්ශණීය පුවත් ලබා දෙන්නේ නැත. මේ ගැටුම් ජයග්‍රහණ, විජයග්‍රහණ හා විනාශයන් වැනි පැහැදිලි සංසිද්ධීන් නිර්මාණය කරන්නේ විරල වශයෙනි; සහභාගි වන්නන්ට කම්කටොලු උපදවමින් එය ඔහේ ඇදී යයි. කෙසේ වෙතත් මෙමඟින් ඒවා හදිසියේ සහ දරුණු ලෙස පුපුරා යාමට ඉඩ නැති ය යන මායාවෙන් මුළා නොවිය යුතුය. එබඳු පුපුරා යාමක් ඇති වන විට එය නිතර ම ජාත්‍යන්තර නිරීක්ෂකයින්ට පෙනෙන්නේ හදිස්සියේ අහසෙන් කඩා පාත් වන්නක් මෙනි. 1994 දී රුවන්ඩාවේ සිදු වූ සමූහ ඝාතන සම්බන්ධයෙන් ලැබුණු මුල් ම ප්‍රතිචාරය එබඳු ය. පුනරුක්ත වූ චක්‍රීය මිනිස් සංහාර සහිත ඓතිහාසික පසුබිමක් තුළ මේ සමූහ ඝාතන සිදු විය. එපමණක් නොව නියත ඛේදවාචකයක් ළඟ එන බව දක්වෙන්නා වු පෙරනිමිති තිබූ බව දූන් දූනගන්නට ලැබී තිබුණත් ප්‍රමාද වූවා වැඩි යැයි වැටහෙන තෙක් ම ඒවා නොසලකා හරිනු ලැබ තිබේ. (අඩෙල්මාන් සහ සුහෘකෙ,1996).

## 3. ගැටුම් හේතු පිළිබඳ න්‍යායයෝ

ආයුධ සන්නද්ධ වීමේ තීරණය වනාහි පුළුල් පරාසයක තත්වයන් සහ හේතු සාධක යටතේ ක්‍රියාකාරීන් බොහෝ දෙනෙකු සම්බන්ධ වන සංකීර්ණ ක්‍රියාවලියකි. එහෙයින් යුද ගැටුමක් පුපුරා යාමේ ඉතිහාසය සාමාන්‍යයෙන් සංකීර්ණ වන අතර, ඒ සම්බන්ධයෙන් කුමන සාධක

අවධාරණය කළ යුතු ද කුමන සාක්ෂි විශ්වාස කළ යුතු ද යන්න පිළිබඳව ඉතිහාසඥයා පරිස්සමින් කරුණු වෙන් කොට සියුම් අයුරින් තෝරා ගැනීම කළ යුතු ය. පොදු ප්‍රපංචයක් ලෙස සන්නද්ධ ගැටුම්වල හේතු පිළිබඳ න්‍යායයික විස්තර විභාගයේ දී, බහුවිධ, අන්තර් ක්‍රියාකාරී, විචල්‍යයන් පිළිබඳ විශ්ලේෂණයක් ඇතුළත් කර ගනී. 1945න් පසු කාලය හෝ සීතල යුද්ධයෙන් පසු කාලය වැනි සීමිත කාල පරිච්ඡේදයක් දෙස බලන විට පවා මෙය සත්‍යයකි (වෙල්ච් 1993, පිටුව 8). පෙන්වා දෙන පරිදි යුද්ධය සඳහා වූ අත්‍යවශ්‍ය කොන්දේසි ඉතා සුළු ගණනක් සහ ප්‍රමාණවත් කොන්දේසි බොහෝ ගණනක් ඇති අතර ඒවායින් සුළු සංඛ්‍යාවක් පමණක් ඕනෑ ම තනි ගැටුමක දී අදාළ විය හැකිය. සටන් කිරීම සඳහා අවශ්‍ය ආයුධ ලැබුණු වහා ම සහ පාර්ශ්ව දෙකක් හෝ වැඩි ගණනක් අතර ආරවුලක් තිබෙන තුරා යුද්ධයක් සිදු විය හැකි ය. කෙසේ වෙතත්, යුද්ධයේ භව්‍යතාව හඳුනා ගැන්ම වඩා සංකීර්ණ ප්‍රශ්නයකි.

ගර් (1970), හොරොවිට්ස් (1985), සහ රැපෝපෝර්ට් (1989) වැනි උගතුන්ගේ කෘතීන්හි කුමක් සඳහන් වුව ද, සන්නද්ධ ගැටුම්වල හේතු පිළිබඳව 1990 න් පසු කරන ලද පර්යේෂණ අවධානයට ලක් කළේ අන්තර්ජාතික ගැටුම් ය. අඩු තරමින් 1945 පමණ සිට අන්තර්ජාතික හෝ අන්තර්-රාජ්‍ය ගැටුම්වලට වඩා සිවිල් හෝ රාජ්‍යාභ්‍යන්තර ගැටුම් සාමාන්‍ය තත්ත්වයක් ගැනීම අපූර්ව තත්ත්වයකි (සිංගර් 1996, පිට 35). කෙසේ වෙතත්, අභ්‍යන්තර හෝ සිවිල් ගැටුම්වල සාපේක්ෂ වැදගත්කම ලෝක දෘෂ්ටි-කෝණයකින් පොදුවේ පිළිගැනුණේ සීතල යුද්ධයේ අවසානයත් සමඟ ය. මෑතක දී පවා මිචිගන් විශ්ව විද්‍යාලයේ යුද්ධ සම්බන්ධිත දත්ත පදනමෙන් කරන ලද ප්‍රධාන පෙළේ විශ්ලේෂණාත්මක විග්‍රහයේ නිගමන හුදෙක් අන්තර්-රාජ්‍ය යුද්ධ ගැන ම යොමු විය (Vasquez 1987). එසේ වුව ද ස්ථාපිත රාජ්‍ය දෙකක් හෝ වැඩි ගණනක් අතර සන්නද්ධ ගැටුම්වල හේතු පිළිබඳව ශාස්ත්‍රීය පර්යේෂණාත්මක ලිපි ලේඛන සම්බන්ධ සිත්ගන්නා සුලු වර්ධනයක් 1990 සිට දක්නට ලැබෙයි. අභ්‍යන්තර ගැටුම් පිළිබඳ වත්මන් පර්යේෂණවල වැඩි අවධානය යොමු වී ඇත්තේ විශේෂයෙන් ම වාර්ගික, පාරිසරික, දේශපාලනික සහ ආර්ථික සාධක කෙරෙහි ය.

**සාපේක්ෂ්‍ය අහිමි කිරීම් න්‍යාය** (Gur-1970) සෞභාග්‍යය සහ බලය සම්බන්ධයෙන් කණ්ඩායම් අපේක්ෂා කළ ප්‍රතිලාභ සහ සැබවින් ම ලැබූ ප්‍රතිලාභ අතර වෙනස පදනම් කරගත් විග්‍රහයක් සපයයි. ආර්ථික සහ දේශපාලනික සාධක සමඟ ඉදිරිපත් කෙරෙන වාර්ගික සාධක කෙරෙහි වඩා නිශ්චිත අවධානයක් දක්වන **සමූහ හිමිකම් න්‍යායය** (Horowitz 1985) සමඟ මේ ප්‍රවේශය සමීප ලෙස සම්බන්ධකම් දක්වයි (Gur 1995 ද බලන්න) එසේ වුවද, ජනවාර්ගික විවිධත්වය ම යුද්ධයේ හේතුවක් ලෙස නො පෙනේ. එය එසේ වන්නේ නම්, වඩාත් යුද නැඹුරු රාජ්‍යයන් වැඩි ම වාර්ගික විවිධත්වයකින් යුක්ත ඒවා විය යුතු මුත්, සැබවින් ඒ එසේ නොවේ (Smith 1997, පිට 30). ඇත්තෙන් ම වාර්ගික සහ ආගමික කාණ්ඩ ගතවීම විසින් විවිධත්වය තුළ එක්ව ජීවත්වීමේ හැකියාවන් උගැන්මට දිරිමත් කරනු ලබන නිසා, එය ප්‍රචණ්ඩ ගැටුම් අනතුරු අඩු කරයි (Collier 1999). එහෙත් මෙම ඉගෙනීමේ ක්‍රියාවලිය අසාර්ථක වනවිට දේශපාලන මෙහෙයවීම් සඳහා සාරවත් පසුබිමක් ඇතිවන හෙයින්, ජනවාර්ගික විවිධත්වය මගින් ගැටුම් අවුස්සා, ඒවා බරපතල ලෙස වර්ධනය කිරීමේ හැකියාව වර්ධනය කළ හැකිය. මේ පිළිබඳ ප්‍රමුඛ නිදර්ශනයක් වන්නේ, පහත සාකච්ඡාවට ලක් කෙරෙන 1990 ගණන්වලදී යුගොස්ලාවියාව කැඩී බිඳී යාමයි.

පරිසර හානිය සහ ගැටුම් අතර සබඳතාව පිළිබඳ පර්යේෂණය, ප්‍රචණ්ඩත්වයට යොමු නොවී වෙනස් වන පරිසර තත්ත්වයන්ට අනුගත වීමට රාජ්‍ය සහ සමාජ සතු වෙනස් වූ (සමහරවිට විනාශකාරී ලෙස පහත්) හැකියා විභාග කරයි (Homer -Dixon 1994). එහෙත් පාරිසරික විනාශයෙන් ප්‍රචණ්ඩ ගැටුම කරා යොමු වීමේ දී දෙක අතර වැදගත්, සරල හා ඍජු වශයෙන් සම්බන්ධතා හඳුන්වා දෙන පර්යෙෂණ ප්‍රවේශයන් දැඩි ලෙස අභියෝගයට ලක්කරනු ලැබ තිබේ (Gleditsch 1998, Lipschutz 1997 ). මෙම තර්කයේ අලුත් ම ප්‍රකාශනය එහි න්‍යායාත්මක අගය එතරම් හුවා දක්වන්නේ නැත. (Homer-Dixon 1999). දැනට සරලව ඉදිරිපත් කෙරෙන තර්කය නම්, පාරිසරික හානිය ගැන සඳහන් නොකොට හයිටියේ සහ පිලිපීනයේ සන්නද්ධ ගැටුම් වැනි සමහර සන්නද්ධ ගැටුම් ඇති වීමට හේතු වටහා ගැනීමට නොහැකි බවයි.

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය කිසිවිටෙකත් එකිනෙකා සමඟ යුද්ධ කරන්නට පෙළඹෙන්නේ නැතැයි යන නිරීක්ෂණයෙන් දේශපාලන ක්‍රම සහ සාමය අතර සබඳතාව පිළිබඳ පර්යේෂණය ආරම්භ වේ (Russett 1993). ලෙවි (1998 පිටුව. 270) මේ සොයාගැන් ම "ජාත්‍යන්තර සබඳතාවන්හි දී අප වෙත ඇති අනුභූතිවාදී නියාමයකට සමීප ඕනෑ ම දෙයක් ලෙස විස්තර කරයි. මෙම තර්කයේ අනුභූතිකවාදී ශක්තිමත් භාවය සම්බන්ධයෙන් සහ එහි න්‍යායාත්මක නිරවද්‍යතාව සම්බන්ධයෙන් මතභේද පැන නැගී ඇත (චැන් විසින් විග්‍රහ කරන ලදී, 1997). එවැනි නිගමනයක් නොමඟ යන ලද පර්යේෂණ යොමුවක් මත පදනම් වී ඇතැයි මැක්මිලන් (1996) තර්ක කරයි. එසේ වුව ද, වැඩිදුර න්‍යායාත්මක සහ සංකල්පමය පැහැදිලි කිරීම් අත්‍යවශ්‍ය වුව ද, අනුභූතිවාදී මතය පුළුල් ලෙස පිළිගනු ලැබ ඇත (Starr 1997).



සන්නද්ධ ගැටුම්වල හේතු පිළිබඳ පර්යේෂණවලට අදාළව අද ඉදිරිපත් වී ඇති උණුසුම් මාතෘකාව වන්නේ පොදුවේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් පිටස්තර රාජ්‍යයන් සමඟ මෙන් එම රාජ්‍යයන් තුළ සාමය පවත්වාගෙන යන්නේ ද යන ප්‍රශ්නයයි. සැබවින් ම එම රාජ්‍යයන් වඩා සාමකාමීය යන තර්කය රමෙන් (1995) විසින් ඉදිරිපත් කරන ලද අතර රිස්-කැපන් (1995) විසින් එය විවාදයට භාජනය කරන ලදී. විවිධ ස්වරූප ගත් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් අභ්‍යන්තර ගැටුම් කෙරෙහි දක්වන විවිධ වූ නැඹුරුව හඳුනා ගැනීම මගින් හේගර්, ගේට්ස් සහ ග්ලෙඩිෂ් (1999) මෙම සාකච්ඡාවට වන මුහුණුවරක් හඳුන්වා දුන්හ. ඔවුන්ගේ නිගමනය වූයේ වඩාත් යුදමය ප්‍රවනතාවක් ඇත්තේ මනා ප්‍රජාතාන්ත්‍රික පමණක් නොව ප්‍රබල ඒකාධිපති රාජ්‍ය වල ද නොවන බවයි. ප්‍රජාතන්ත්‍රවාදය වෙතට සංක්‍රාන්තිය විශේෂයෙන් ම භයානක ය (Jaggers and Gurr 1995, පිටු 477-8). පද්ධතීය සංක්‍රාන්තිය මධ්‍යයේ සිටින සහ කැඩී බිඳී යන ෆෙඩරල් රාජ්‍ය සමාජයක් ලෙස, පැරණි යුගෝස්ලෝවියාවේ සහ පැරණි සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයේ ප්‍රචණ්ඩ ගැටුම් ද 1998 දී සුහර්තෝ පාලනය අවසාන වීමෙන් පසු ඉන්දුනීසියාවේ ඇති වූ ප්‍රචණ්ඩ ක්‍රියා ද වටහා ගැනීමට, මෙම තර්කය සැලකිය යුතු තරම් ආලෝකයක් සපයයි.

කෙසේ වුව ද, සමස්තයක් වශයෙන්, වඩාත් වැදගත් පැහැදිලි කිරීමේ සාධක ලෙස ආර්ථික කොන්දේසි මතු වී පෙනෙයි. මෙහි ඇති ප්‍රධාන ම කාරණය වන්නේ පහත් මට්ටමක ආර්ථික සංවර්ධන යයි (Hauge and Ellingsen 1998). පහළ මට්ටමේ සාමාන්‍ය ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය මගින් හෝ අසමානුපාතික විශාල කෘෂිකාර්මික අංශයක් මගින් හෝ භාණ්ඩ හා ප්‍රාග්ධනය පිළිබඳ ලෝක වෙළෙඳපළේ විතැන්වීම්වලින් රටේ ආර්ථිකය පීඩාවට පත්වීම මගින් මෙය පෙන්නුම් කළ හැකි ය

(Avery and Rapkin 1986). හේග් සහ එලිංසන් (1998) මෙන් ඕවිනන් (1997) ද දුර්වල ආර්ථික තත්ත්වයනට අමතරව, ප්‍රජාතන්ත්‍රවාදීය ඉඩ ප්‍රස්ථා අඩුවීම වැදගත් ද්විතීයික සාධකයක් ලෙස හඳුනා ගනී. දිළිඳු සමාජයන්හි ආර්ථික අතිරික්තය කෙතරම් කුඩා වුව ද, එහි පාලනය සියතට ගැනීම වෙනුවෙන් එම රටවල නායකයින් සාමාන්‍යයෙන් එකිනෙකා සමඟ තරග කරතියි කෝලියර් (1999; Collier and Hoeffler 1999 ද බලන්න) ඉදිරිපත් කළ තර්ක මගින් මෙම සොයා ගැනීම් තහවුරු කෙරේ. දිළිඳු සමාජවල මෙන් පවත්නා අතිරික්තය ස්වල්ප වූ විට හෝ විනාශකාරී පරිහානියක් ඇති විට, අතිරික්තය සඳහා තරඟය උග්‍ර වීමෙන් ප්‍රචණ්ඩ සටන් ඇවිලයාමක් බොහෝ දුරට ඇති විය හැකි ය. 1989 සිට 1997 දක්වා ලයිබීරියාවේ සිදු වූ භයානක ප්‍රචණ්ඩ ක්‍රියා, 1991 සිට සියරාලියෝන් හි කෙරෙන යුද්ධය, දශක ගණනාවක් ඇංගෝලාවේ කෙරෙන යුද්ධය සහ බුරුණ්ඩියේ සහ රුවන්ඩාවේ සමූහ ඝාතන චක්‍ර සහ රුදුරුකම් මෙම ප්‍රවේශය මගින් ඉස්මතු කර දක්වන ලද බොහෝ නිදර්ශන අතර වේ.

මේ සියල්ල මගින් පහත සඳහන් සරල පොදු නිගමනයනට පැමිණිය හැකි ය.

- රාජ්‍යයන් තුළ අද ඇතිවන සන්නද්ධ ගැටුම්වල ඉතා වැදගත් දීර්ඝ කාලීන හේතු වන්නේ දුර්වල ආර්ථික තත්ත්වයන් ය.
- විශේෂයෙන්ම සංක්‍රාන්තික වකවානුවල දී මර්දනකාරී දේශපාලන ක්‍රම ද යුද නැඹුරුව තීව්‍ර කරයි.
- යළි අලුත් කළ හැකි සම්පත්වලට සිදු වන හානිය ද (විශේෂයෙන් ම පාංශු ඛාදනය, වන විනාශය සහ ජල හිඟය) ප්‍රචණ්ඩ ගැටුම් ඇතිවීමේ හැකියාවට සැලකිය යුතු තරමින් දායක විය හැකි නමුත් එය දේශපාලන හා ආර්ථික නිර්ණායක තරම් කේන්ද්‍රීය නොවේ.
- ජනවාර්ගික විවිධත්වය පමණක් සන්නද්ධ ගැටුමට හේතුවක් නොවුවත් ගැටුමක පාර්ශවකරුවෝ ඔවුන්ගේ වාර්ගික අනන්‍යතාව මගින් නිර්වචනය වෙති.

## 4. පසුබිම් හේතු සහ අභිමුඛ සාධක

සන්නද්ධ ගැටුම් හේතු සම්බන්ධයෙන් පොදු පැහැදිලි කිරීමක් වර්ධනය කිරීම සඳහා ඒවායේ පසුබිම් තත්වයන් සහ දුර-ගාමී හේතූන් කෙරෙහි සමාජීය විද්‍යා න්‍යායය අවධානය යොමු කරයි. එහෙත්, අප වෙනත් ඕනෑ ම සහේතුක සාධාරණීකරණයකට දෙන ගෞරවයට වැඩි ගෞරවයක් මෙම න්‍යායයන්ට දිය යුතු නැත. සංඛ්‍යාත්මක සාධාරණීකරණය පදනම් කරගත් මේවාට නිතරම විකල්ප පවතී. දිළිඳු ප්‍රජාතාන්ත්‍රීය නොවන රාජ්‍යවල සන්නද්ධ ගැටුම් සඳහා ප්‍රවණතාවක් ඇති නමුත්, එතරම් ම දුප්පත් නොවන සහ වඩාත් මර්දනකාරී නොවන සමහර රටවල ද බොහෝ සන්නද්ධ ගැටුම් ඇත. එසේම අතිශයින්ම දිළිඳු සහ මර්දනයට ලක් වුවත් යුද්ධයක් නැති රටවල් ද ඇත.

ශාස්ත්‍රීය ලේඛනවල ඇති එක් ගැටලුවක් නම් ඒවා සාමාන්‍යයෙන් සන්නද්ධ ගැටුම සඳහා බලපෑ ප්‍රධානතම ගැටලුව ගැන පමණක් අවධානය යොමු කිරීමයි. කෙසේ වුවත්, මෙය බොහෝ ප්‍රත්‍යෙකවල දී නොමඟ යවන සුලු කරුණකි. ප්‍රශ්නය වන්නේ කුමන හේතුව අනෙක් හේතූන්ට වඩා වැදගත් වන්නේ ද යන්න නොව, විවිධ හේතූන් අන්තර් ක්‍රියාකාරී වන්නේ කෙසේද යන්නයි. විශේෂයෙන් ම සන්නද්ධ ගැටුමට බලපෑ ආර්ථික සහ දේශපාලන කාරණා අතර තෝරාගැනීමක් කරන ලෙසට කරන

බල කිරීම නොමග යවනසුලුය. ආර්ථික විෂමතා සහ පාරිසරික හානිය ඉස්මතු කොට දක්වන පැහැදිලි කිරීම්, මගින් ජීවිතයේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ ප්‍රශ්නය විසින් ජනතාව ගැටුම්වලට පොළඹවනු ලබන්නේ කෙසේද යන්න විස්තර කෙරෙයි. ආයුධ අතට ගැනීම නීත්‍යානුකූල වීම මෙන්ම එය ජීවිතයේ අවශ්‍යතා සපුරා ගැනීමේ එකම මග ද වන්නේ යැයි මිනිසුන් විශාල පිරිසක් සිතන්නේ නම් ප්‍රචණ්ඩ ක්‍රියා පහසුවෙන් වර්ධනය වේ. වෙනත් වචනවලින් කියන්නේ නම් තමන් අසාධාරණයට ලක් වී සිටින බවත්, එහෙයින් එම වරද නිවැරදි කිරීමට තීරණය කළ යුතු බවත් වශයෙන් ඔවුන් පොළඹවනු ලැබ දිරිමත් කරනු ලැබූ විට, ඔවුහු දේශපාලනිකව ක්‍රියාකාරී වෙති. කෙසේ වෙතත් මිනිසුන් විශාල වශයෙන් මෙවැනි තීරණ ගන්නේ ආකස්මිකව නොවේ. දේශපාලනිකව මෙහෙයවනු ලබන මේ මිනිසුන්ගේ විශ්වාසය හා හොඳ හිත දිනාගන්නා ප්‍රමාණය හා, ඔවුන්ගේ පක්ෂපාතීභාවය හා කැපවීමේ ප්‍රමාණය අනුව, ඔවුන් සන්නද්ධ අරගලයකට යොමු කරවිය හැකිය. එබැවින් ප්‍රචණ්ඩ ගැටුම් සහ ඒවා වර්ධනය වීම් හා සමනය වීම් පිළිබඳ කිසිම අර්ථවත් විශ්ලේෂණයක් සඳහා දේශපාලන පරිමාණය නොතකා හළ නොහැකිය.

මේ පිළිබඳ විශ්ලේෂණාත්මක ගැටලු අතරින් එකක් වන්නේ දේශපාලන න්‍යායය සහ දේශපාලන භාවිතය අතර අනනුරූපතා තුළ ය. දිගු කාලීන තත්වයන් සහ පොදු විස්තර විභාග කෙරෙහි අවධානය යොමු කරන න්‍යායය, විශ්වීයත්වය ඉලක්ක කර ගැනීම මගින් නියතාර්ථවත් බව අහිමි කරගනී (Levy 1989, p. 297). පුළුල් රාමුව තුළ දේශපාලන චර්යාවේ විස්තරාත්මක ලක්ෂණ ගිලිහී යා හැකි ය. සන්සන්දනාත්මකව බලන විට, දේශපාලන නායකයින් තුළ නිතරම පුළුල් ක්‍රමෝපායික දැක්මක් අවධාරණය කිරීමේ ප්‍රවණතාවයක් ඇතත් අවසානයේ දී ඔවුන්ගේ පැවැත්ම රැඳී ඇත්තේ විස්තර විභාග දැක්වීමේ හැකියාව මත ය. සමාජ විද්‍යා න්‍යායයන් දුර-ගාමී දෘෂ්ටීන්ගෙන් සමන්විත වුව ද, දේශපාලනයේ දී ප්‍රමුඛත්වය ගන්නේ කෙටි කාලීන තත්ත්වයන්ය. ඒ අනුව, ලෝක ප්‍රපංචයක් ලෙස සන්නද්ධ අරගල වටහා ගැනීමට වෑයම් කිරීමේ දී සමස්ත සමාජ - ආර්ථික රාමුව සැලකිල්ලට ගත යුතු වන නමුත්, නිශ්චිත සන්නද්ධ ගැටුමක් විශ්ලේෂණය කිරීමට දරන උත්සාහයේ දී ඒ වෙනුවට නිශ්චිත සංවිධාන සහ පුද්ගලයින්ට අදාළ දේශපාලනය කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වනු ඇත.



මෙසේ, එක් අතකින් පුළුල් න්‍යායාත්මක සාධාරණීකරණ සහ අනෙක් අතින් විස්තරාත්මක විශ්ලේෂණ යන මෙම වෙනස් වූ මට්ටම් වෙන් වෙන්ව පවත්වා ගැනීමට ඉඩ දෙනවාට වඩා ඒවා ඒකාබද්ධ කිරීමේ මාර්ග සෙවීම වඩා ඵලදායකය. කුමන සිදුවීම්වලට ප්‍රමුඛතාව දෙන්නේ ද, වැඩිම අනතුර ඇත්තේ කොහි ද, යන්න දැන ගැනීමට පුළුල් සාධාරණීකරණය විශ්ලේෂකයාට ප්‍රයෝජනවත් මඟ පෙන්වීමක් කරන්නේ එවිටය.

එවැනි ප්‍රවේශයක් අනුගමනය කරන්නේ නම්, හේතුකාරක පැහැදිලි කිරීම් මගින් සමාජ, සංස්කෘතික, ආර්ථික සහ පාරිසරික පසුබිම පිළිබිඹු කළ යුතුවා පමණක් නොව අභිමුඛ වූ දේශපාලන තත්ත්වය ද සැලකිල්ලට ලක් කළ යුතුය. වෙනත් අයුරකින් කීවොත්, දීර්ඝ කාලීන ව්‍යුහාත්මක පැහැදිලි කිරීම්වලට අමතර ව අප දේශපාලනය ද සැලකිල්ලට ලක් කළ යුතුය. ශ්‍රේෂ්ඨ ප්‍රසියානු යුද කටයුතු පිළිබඳ දාර්ශනික ක්ලෝස්විට්ස් (1832/1976) යුද්ධය යනු "අප සතුරන් ලවා අපගේ අභිලාෂය ක්‍රියාත්මක කිරීමට බල කිරීමේ ක්‍රියාවක්" ලෙස ද "වෙනත් ක්‍රම මගින් ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යාමක්" ලෙස ද

නිර්වචනය කළේය. ජනතාව යුද්ධයට පොළඹවන හේතු සහ යුද්ධයට පෙළඹෙන ආකාරය සංස්කෘතිය විසින් හැඩගස්වනු ලබන අන්දම නොතකා හරින නිසා, යුද්ධය පිළිබඳ එවැනි නිර්වචනයක් නොමඟ යවනසුලු යැයි කීගන් (1994, පිටු 3-12) තර්ක කරයි. ක්ලෝස්විට්ස්හට හේතු ගවේෂණය වැඩියෙන් ඉස්මතු කිරීමට ඉඩ හැරීම පැහැදිලි වරදක් වනු ඇත; එසේ වුවද පසුබිම් සාධක විසින් සිද්ධි සන්නද්ධ අරගල වෙතට තල්ලු කරනු ලබන්නේ දේශපාලනය හරහා පමණි. යුද්ධ සවිඥානික සේම සවිඥානික ලෙස තීරණය කෙරෙන කටයුතු ය. ඒවායේ හේතු පිළිබඳ පැහැදිලි කිරීමට පසුබිම සේ ම අභිමුඛ කරුණු ද සහ ව්‍යුහාත්මක හේතු හා දේශපාලන ක්‍රියාකාරීන්ගේ තීරණ ගැනීමේ බලය තුළ ඇති සාධක යන කරුණු දෙක ද ඇතුළත් කරගත යුතුය. කෙටියෙන් කිවහොත්, සන්නද්ධ ගැටලුවලට හේතු පිළිබඳ පුළුල් විග්‍රහයක් විශ්ලේෂණයේ මට්ටම් සහ වර්ග යන දෙක ම මත පදනම් විය යුතුය.

## 5. ක්‍රමවේදය සහ ප්‍රවර්ගීකරණය

එවැනි බහු මට්ටම් විශ්ලේෂණයක් ගැන සලකා බැලීම පිණිස ඩෙස්ලර් (1994) හොඳ විමංසන-ලක්ෂ්‍යයක් ඉදිරිපත් කරයි. ඔහු සන්නද්ධ ගැටලුවලට බලපාන විභව හේතුන්ගේ විවිධත්වය තුළ වෙනස් වූ හේතුන් පමණක් නොව, විවිධ හේතු ප්‍රවර්ග ද දක ඒවා ගොනු කර ගැනීම සඳහා කොටස් හතරක ප්‍රවර්ගීකරණයක් ද ඉදිරිපත් කරයි. පාරිභාෂික ශබ්ද මාලාවේ වෙනස්කම් කිහිපයක් සහ අන්තර්ගතයේ එක් වෙනසක් ද සහිතව, ඔහුගේ තර්කවලින් ගොඩ නැගෙන විශ්ලේෂණ රාමුව පහත දක්වෙන ආකාරයට සාරාංශ කළ හැකිය:

- <u>පසුබිම් හේතුන්</u> (ඩෙස්ලර්හි Channels = මාර්ග, 1994) "පුද්ගල මට්ටමින් නොව, කණ්ඩායම් මට්ටමින් දක්නට ලැබෙන, මූලධර්ම හා සබැඳි දේශපාලනික, සමාජ ආර්ථික හෝ ජාතික භේදයක" මූලික අංග වේ. එක් කණ්ඩායමක් බලයෙන් බැහැර කිරීම හෝ ක්‍රමානුකූලව අනෙක් කණ්ඩායම්වලට පක්ෂපාතීව කටයුතු කිරීම හෝ ප්‍රාදේශීය ආර්ථික වෙනස්කම් හෝ මේවායේ සංයුතිය ඇති විය හැකි ය. කෙටියෙන් කියතොත්, මෙහි දී දක්නට ලැබෙන්නේ සමාජ සහ ආර්ථික ව්‍යුහයේ මූලික ලක්ෂණයි. ඒවා ගවේශනය කිරීම යනු ගැටුමේ පසුබිම් හේතු සහ පාදක තත්වයන් ගවේෂණය කිරීමයි.

- <u>සජ්ජිත වීමේ / කිරීමේ උපාය මාර්ගය</u> (ඩෙස්ලර් හි targets = ඉලක්ක, 1994) තුළ ප්‍රධාන දේශපාලන ක්‍රියාකාරීන්ගේ අරමුණ සහ (මෙය ඩෙස්ලර්ගේ තේමාවෙන් මාගේ විචලනයයි.) ඔවුන් තම අරමුණු සපුරා ගැනීමට උත්සාහ කරන අන්දම යන දෙක ම ඇතුළත් වේ. වෙනත් වචනවලින් කියතොත්, අප ජනයා සජ්ජිත කිරීමේ සංස්කෘතිය විසින් උපාය මාර්ගය විග්‍රහ කරන විට, ගැටලු සංකල්පනය කරන අන්දම සහ ඒවා ඉදිරිපත් කරන අන්දම යන දේශපාලන චර්යාවේ මුළු පරාසය ම අපි සලකා බලන්නෙමු. එබැවින් අපි ජනතාව සටන් කරන හේතු දෙස බලන අතර, ඔවුන් එම හේතු අවබෝධ කරගන්නා ආකාරය ද සලකා බලන්නෙමු.

- <u>ප්‍රාරබ්ධක</u> (triggers) යනු සන්නද්ධ ගැටුමේ ආරම්භය සඳහා වූ කාලය නියම කරන සාධකයි. ගැටුමක් ඇති වූයේ මන්ද යන්න නොව, එය එම අවස්ථාවේ දී ඇති වූයේ මන් ද යන්න විස්තර කිරීම පිණිස මෙම විමසා බැලීම උපකාරී වේ. ඒවා නිතර ම ක්‍රියාකාරීන්ගේ තෝරා ගැනීම සීමාවන

පරිදි වැදගත් ක්‍රියාකාරීන් විසින් මෙහෙයවනු ලබන, සාමකාමී ප්‍රවේශයනට වඩා ප්‍රචණ්ඩකාරී විකල්ප වඩා ආකර්ශණීය වන සිද්ධීන් සහ ක්‍රියාවන් ය.

- උත්ප්‍රේරක (Catalysts) ගැටුමේ තීව්‍ර බව සහ කාල සීමා නියම කරන සාධකයි, ඒවා ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයන්ගේ හමුදා බල තුලනය වැනි අභ්‍යන්තර සාධක හෝ එ.ජා මැදිහත් වීම වැනි බාහිර සාධක විය හැකි ය. ඒවා උපක්‍රම (උදාහරණයක් වශයෙන් කැරැලිකරුවන් සිවිල් වැසියන් වෙසෙන ප්‍රදේශවලට පහර දීමෙන් වැළකීම) හෝ භූමි නිර්මාණය, ඍතු හෝ කාලගුණය වැනි ස්වභාවික ප්‍රපංචයන් විය හැකි ය. ඒවා ලැබෙන ආයුධ ප්‍රමාණය වැනි භෞතික සාධක හෝ යුද්ධ කළ යුතු ආකාරය පිළිබඳ සංස්කෘතිකමය දෘෂ්ටිය වැනි සංයුක්ත භාවයෙන් අඩු එහෙත් වැදගත්කමෙන් වැඩි සාධක විය හැකි ය.

මෙම ප්‍රවර්ගීකරණය පසුබිම් තත්ත්වයන් වෙතින් ක්‍රියාකාරීන් වෙතටත්, යළි ආපස්සටත් වශයෙන් යොමුව මාරු කරයි. එය හේතුඵල න්‍යායයක් නොසැපයුව ද, න්‍යායය ගොඩනැගීමේ ක්‍රමයක් සපයයි. එය සංසිද්ධීන් විභාග කොට සොයා බැලිය යුතු කෝණයක් පෙන්නුම් කරන අතර ගැටුම් වර්ධනය වීම පිළිබඳ තනි සිදුවීම් සම්බන්ධයෙන් වූ විශ්ලේෂණයන් ගොඩ නැගීමේ ක්‍රම යෝජනා කරයි. ප්‍රචණ්ඩ ගැටුම් වර්ධනය වැළැක්වීමට ගන්නා ඕනෑ ම උත්සාහයක දී පිළියම් යෙදිය යුත්තේ විශේෂයෙන් ම පළමු වර්ග දෙක වන පසුබිම් හේතු සහ සජ්ජිත වීමේ ක්‍රමොපායයන්ට ය. ප්‍රචණ්ඩ ක්‍රියා අවසන් කරන ආකාරය සලකා බලන විට අවසාන වර්ගය-උත්ප්‍රේරක-ද ඒ හා සමාන ලෙස වැදගත් ය.



## 6. අසාධාරණය සහ සජ්ජිත කිරීම

දේශපාලන ක්‍රියාකරුවන් ව්‍යුහාත්මක හා පසුබිම් කාරණා සම්බන්ධයෙන් කටයුතු කරන තැන්වල, දිගු කාලීන සහ කෙටි කාලීන හේතු එකිනෙක ඡේදනය කරන ස්ථාන පෙන්නුම් කරන සංකල්ප දෙකක් ඇත. ඒ සංකල්ප නම් සාධාරණය සහ ජනතාව සජ්ජිත කිරීමයි.

දුර්වල ආර්ථික තත්ත්වයන් සහ දේශපාලන අවස්ථා අඩුකම එක්තැන් වී ද්විත්ව අසාධාරණයක් ලෙස ක්‍රියා කරයි. අසාධාරණය නැමැති තේමාව වටා දේශපාලන සජ්ජිත වීම සිදු වේ. සාධාරණ යැයි තමන් විශ්වාස කරන හෝ අඩු තරමින් තමන්ගේ ජීවිතවල දකින අසාධාරණයට පිළියම් සැලසෙනු ඇතැයි ඔවුන් සිතන පරමාර්ථ වෙනුවෙන් ජනතාව ස්වයං කැපවීමක යෙදෙති. ඒ අනුව සමාජයක් තුළ හෝ විවිධ රටවල් අතර, බලය හා සෞභාග්‍යය සම්බන්ධයෙන් ඇතිවන බෙදීම් හේතුවෙන් පැන නගින, වාසියට හරවා ගත හැකි අසාධාරණය පිළිබඳ හැඟීමක් දේශපාලන සජ්ජිත වීම සඳහා මූලික අංගය වේ.

සාකච්ඡාවේ මෙම අවස්ථාවේ දී සාවධානව සලකා බැලිය යුතු විශේෂතා කීපයක් සඳහන් කළ යුතු ය. මෙහි එන තර්කය උදාහරණයක් වශයෙන් සර්බි ජනතාවගේ දුඃඛිත ජීවිතය නිසා ඇති වුණු අසාධාරණය පිළිබඳ දැවෙන හැඟීමකින් යුගෝස්ලෝව් නායක ස්ලොබොදාන් මිලොසොවිච් ක්‍රියා කළේ ය වැන්නක් නොවේ. ඒ සම්බන්ධයෙන් ලැබී ඇති සාක්ෂිය නම් ඔහු මූලික වශයෙන් ඔහුගේ සහ ඔහුගේ නායකත්වය වටා එක්සත්ව සිටි කුඩා කණ්ඩායමකගේ බලය ස්ථාවර කිරීම සම්බන්ධයෙන් උනන්දු වීය යන්නයි (Little and Silber 1995; Judah 1997;1990). එසේ වුව ද සර්බිවරුන්ට සිදු වූ අසාධාරණයන් පිළිබඳ මැසිවිලිවලින් ඔහුගේ ව්‍යක්ත කථා පිරී තිබේ. 1987 සිට ඔහු නිරතුරුව හා පුන පුනා සර්බි

දුක්ගැනවිලි ගැන කථා කළේ ය. තමාට අසාධාරණයක් වූ බවක් ඔහුට කෙසේ දැනුණත් එම සංකල්පය ප්‍රයෝජනයට ගන්නා ආකාරය ඔහු දැන සිටියේ ය. ඔහුගේ දේශපාලන ජීවිතයේ මේ කාරණයේ දී ඔහු මූල රූපයකි. අසාධාරණය පිළිබඳ වූ වාසි සහගත හැකි හැඟීමක් මත ඔහු ඉතා සාර්ථක ලෙස ක්‍රියා කළේය.

සාධාරණත්වය සන්නද්ධ අරගලයේ දී ප්‍රබල පෙළඹුම් සාධකයක් ලෙස ක්‍රියාත්මක වෙති යි, යන මෙම අදහස, "දුක්ගැනවිල්ල පිළිබඳව මහ හඬින් කරන දේශනාව නොව තෘෂ්ණාවේ නිහඬ බලය" ලෙස අවධාරණය කිරීම මගින් අභියෝගයට ලක් කරනු ලැබ ඇත (Collier - 1999). භාෂාව සහ දේශනාව කොතරම් දුරට අවධාරණය කළ යුතු ද යන්න වටා මෙම තර්කය එක්තරා දුරකට ගොඩ නැගේ. ප්‍රධාන ක්‍රමවේදී තර්කය නම් පර්යේෂණ අරමුණු සඳහා "සාධාරණත්වය පිළිබඳ ඉල්ලීම දුක්ගැනවිලි ඉපිදවීමේ තත්ත්වයන් ලෙස ප්‍රතිසූත්‍රගත කළ හැකිය," යන්නයි (Collier and Hoeffler 1999, පිට 5). එහෙත් නියත වශයෙන් ම සජ්ජිත වීම සහ සංජානනය ඇත්තේ ඉල්ලුම තුළ වන හෙයින්, ආත්මමූලක ඉල්ලීමක් විෂය-මූලක තත්ත්වයක් ලෙස ප්‍රතිසූත්‍රගත කිරීම නොමඟ යවනසුලු ය. කෙසේ වුව ද, විශේෂයෙන් දුක්ගැනවිලිවලට එරෙහි තෘෂ්ණාව පිළිබඳ තර්කය, කාගේ තෘෂ්ණාව ද, කාගේ දුක්ගැනවිල්ල දැයි කියා ප්‍රශ්න කිරීම මගින් සාරාංශ කොට නිසි චිත්‍රයකට නඟාගත හැකි ය. උදාහරණයක් වශයෙන්, මිලොසොවිච් බල තෘෂ්ණාවෙන් පෙළෙති යි යන්නෙන් සාමාන්‍ය සර්බිවරුන්ට දුක්වේදනා නොදැනේ යැයි අදහස් නොවේ. වෙනත් වචනවලින් කියතොත්, විචාරාත්මක විචල්‍ය ලෙස තෘෂණාව සහ දුක්ගැනවිලි අතරින් එකක් තෝරා ගැන්ම අත්‍යවශ්‍ය නොවිය හැකි ය. එසේ නොව මේවා දේශපාලන සජ්ජිත වීම සම්බන්ධ අනුපූරක වන සහ අන්‍යෝන්‍ය ශක්තිකාරක සංරචක විය හැකිය. 153

## 7. ජනවාර්ගිකත්වය සහ ගැටුම

ඉහත දැක් වූ තේමාවන් විවරණය කිරීම සඳහාත්, විශ්ලේෂණය පිණිස ඒවායේ බලපෑම විමසා බැලීම සඳහාත්, ජනවාර්ගික ගැටුම් ලෙස පර්යෙෂණ සාහිත්‍යයේ සහ වඩා ජනප්‍රිය විචාරයන් හි සඳහන් ප්‍රවර්ගය දෙස වඩාත් සමීපව බැලීම උපකාරී විය හැකි ය. මෙය සාමාන්‍යයෙන් අර්ථකථනය කරනුයේ අදාළ පාර්ශ්වයන් ජනවාර්ගික ව වෙනස් ය යනු පමණක් නොව, ජනවාර්ගික වෙනස්කම ගැටුමට කේන්ද්‍රීය වී ඇතැයි යනුවෙනි. එය අඩු තරමින් එක් පාර්ශ්වයකගේ විස්තරයක් පමණක් නොව, ගැටුමේ එක් හේතුවක් (එක ම හේතුව නොවේ නම්) ජනවාර්ගික වෙනස්කම කෙරේ ආරෝපණය කිරීමක් වෙයි.

ජනවාර්ගික විපරීතතාව පිළිබඳ නිර්වචනය දැඩි මත භේදයට ලක් වූත් වින්‍යාස කොට දැක්වීම බෙහෙවින් දුෂ්කර වුත් එකකි. ජනවාර්ගික අනන්‍යතාව පුළුල් පරාසයක වූ විවිධ පදනම් ඇසුරින් හඳුනා ගනු ලැබ ඇති හෙයින්, සාධාරණීකරණය විශේෂයෙන් ම දුෂ්කර මෙන් ම නොමඟ යවනසුලු ය. විවිධ අවස්ථාවලදී බොහෝ කණ්ඩායම් භාෂාව, ජවි වර්ණය, ආගම, ස්ථානය හෝ ඉතිහාසය වැනි සලකුණු එකතුවක් මාර්ගයෙන් වාර්ගිකව එක්සත් වූ ප්‍රජාවක් ලෙස තමන් හඳුන්වා ගනිති. නිශ්චිත වාර්ගික අනන්‍යතාවක් නිශ්චය කිරිමේ දී තීරණාත්මක වන්නේ බෙදා හදා ගත් ඓතිහාසික අත්දැකිම්, පුරාවෘත්ත සහ ආගමික ඇදහිලි හෝ තනිව ගත් වෙනත් විශේෂ ලක්ෂණ නොවේ. මේවා තීරණාත්මක වන්නේ ඒවා එක් කණ්ඩායමක සාමාජිකයින් වෙනත් කණ්ඩායම්වල සාමාජිකයින්ගෙන් යම් විශේෂ වූ

ක්‍රමයකට වෙන් කොට දක්වන බවට පොදු පිළිගැනීමක් ඇති විට පමණි. එම පිළිගැනීම තහවුරු කරන සාධක දෙකක් නම් අනෙකුත් කණ්ඩායම්වලට සාපේක්ෂව වෙනස්කම්වලට ලක්වීමේ අත්දැකීම සහ අදාල කණ්ඩායමේ පිළිගත් එල ප්‍රයෝජන ආරක්ෂා කිරීම සඳහා හිතාමතා දේශපාලන වශයෙන් සජ්ජීත වීමයි.

1990 ගණන්වල පැවැති බෝල්කන් ගැටුම්වල දී දැඩි රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාවලින් - හිස් ගෙඩි කිහිපයක් එකට හැප්පීමෙන්-ප්‍රශ්නයට පහසුවෙන් පිළියම් යෙදිය හැකි යැයි විදේශ බලවේගවල රාජ්‍ය තාන්ත්‍රිකයෝ ත් දේශපාලනඥයෝ ත් සලකන්නට පටන් ගත්හ (Little and Silber 1995 පිට 159). එය නිසි වගකීමෙන් තොර වීම මිස වඩා ගැඹුරු හේතු ඊට නැතුවාක් මෙනි. එම මතය වැරැදි යයි ඔප්පු වූ විට, ගැඹුරු හේතු සොයනු ලබන නමුත්, එය ද වඩා නිවැරැදිව කෙරෙන්නේ නැත. "අතීත ජනවාර්ගික වෛරය" නිසා බොස්නියා-හර්සගොවිනාවේ යුද්ධය ඇති වී යැයි ඇමෙරිකානු රාජ්‍ය ලේකම් වොරන් ක්‍රිස්ටෝෆර් ප්‍රකාශ කළේ ය (Calhoun 1997, පිට 61). බෝල්කන්වරුන් පිළිබඳ ජාත්‍යන්තර කොමිසම (1996, පිට 13, 14) ප්‍රශ්නය සම්බන්ධයෙන් බෝල්කන් ජනතාවගේ වහා කිපෙනසුලු ස්වභාවයට චෝදනා කරන පොදු මතයක් පෙන්වා දී එය විවේචනය කළේ ය. එම ගැටුම් සමනය කිරීමට හෝ එවැනි ජනතාවකට උපකාර කිරීමට හෝ එතරම් දෙයක් කළ නොහැකි යැයි (ජනවාර්ගික ගැටුම් යන පදය නිතර භාවිත නො කළ ද) එම තර්කවලින් කියැ වේ.

ජනවාර්ගික ගැටුම්හි පක්ෂග්‍රාහීන් යොදාගන්නා යෙදුම්වලට සමාන යෙදුම් භාවිතය ද පැමිණෙන නිගමනවලට එළඹීම ද සමාන නිගමනවලට මෙවැනි තර්කවලට පොදුය. උදාහරණයක් වශයෙන්, ජනතාව බලහත්කාරී ලෙස බෙදා වෙන් කිරීමෙන් පමණක් ජනවාර්ගික සිවිල් යුද්ධ අවසන් කළ හැකි යැයි කවුෆ්මාන් (1996) නිගමනය කරයි. අනෙක් අතට මෙය වාර්ගික පාවිත්‍රීකරණය ලෙස හැඳින්වෙන අතර, මිශ්‍ර විවාහයකින් කිසිවකු බිහිවීමේ හැකියාවක් නැතැයි ද වාර්ගික පාවිත්‍රීකාරකයන් ඇතුළු සෑම කෙනෙකු ම එක්කෝ එක් කණ්ඩායමකට (උදාඃ සර්බි) හෝ වෙනත් කණ්ඩායමකට (උදාඃ බොස්නියානු) අයත් විය යුතු යැයි ද සැලකේ.



සදාචාරමය ගැටලුව පසෙක තිබිය දී, විචාරකයින් ඉහත දැක් වූ වියුක්ත ප්‍රාවර්ගික ප්‍රභේද ප්‍රයෝජනයට ගන්නා විට, ගැටුම් හේතු මේ ආකාරයට ගෙනහැර දැක්වීමේ දී ඇතිවන බුද්ධි විෂයක අඩුපාඩු ඉතා හොඳින් අනාවරණය වේ. බෝල්කන් රටවල යුද්ධය සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන අතීත වෛරය හා කිපෙනසුලු ස්වභාවය පිළිබඳ මත වර්තමානය සම්බන්ධයෙන් වැරැදි තුනක් (අතීතය සම්බන්ධයෙන් බොහෝ ගණනක්) ඇති කරයිඃ එම වැරදි නම්, ගැටුම් සඳහා එකම පසුබිම් සාධකය ලෙස ජනවාර්ගිකත්වය හුවා දැක්වෙන අතර එයම එකම සාධකය ලෙස විස්තර කෙරෙන හෙයින්, වෙනත් සාධකයන්හි කාර්ය භාරය සලකා බැලීමට අසමත් වෙයි. විශේෂයෙන් වැදගත් වන්නේ ඒවා ජනතාව සජ්ජීත ක්‍රීමේ උපාය මාර්ග මුළුමනින් ම නොතකා හැරීමයි.

වරද ඇත්තේ ජනවාර්ගික වෙනස්කම් මූලික සමාජමය බෙදීමක් ලෙස ද එනිසා ම පසුබිම් හේතුවක් ලෙස ද සැලකීමෙහි නොවේ. වරද නම්, ඒ මූලික බෙදීමට යුද්ධය සඳහා වූ පූර්ව තත්ත්වයක් නිර්මාණය කිරීමට හැකි වන්නේ කෙසේ ද යන්න නොතකා හැරීමයි. ජනවාර්ගික වෙනස බොහෝ විට ගැටුම්වල වෙළී පැටලී තිබෙන බවද, තමන් සටන් කරන මූලික කාරණය සැබවින් ම ජනවාර්ගික

වෙනස්කම්යැයි පීඩාවට පත් පුද්ගලයින් බොහෝ විට විශ්වාස කරන බවද ප්‍රත්‍යෙක අධ්‍යයන ගණනාවකින් පෙන්නුම් කොට තිබේ. මෙය වැදගත් නමුත් ප්‍රමාණවත් නොවන්නේ අප දැනටමත් සලකා බලා ඇති පරිදි, ප්‍රචණ්ඩ ගැටුම්වලට මැදි වී ඇත්තේ ලෝකයේ වඩාත් ජනවාර්ගික විවිධත්වය සහිත රටවල් නොවන නිසා ය. ජනවාර්ගිකත්වයෙන් බෙදුණු පාර්ශ්වකරුවන් සම්බන්ධ වන සන්නද්ධ ගැටුම්වලදී පවා ජනවාර්ගිකත්වය දෙස පමණක් බලා තත්ත්වය ප්‍රමාණවත් ලෙස විග්‍රහය කළ නොහැකි බැව් මෙයින් හැඟෙයි. ඉහතින් දැක් වූ ප්‍රමාණාත්මක පර්යෙෂණ ප්‍රතිඵල ආර්ථික තත්ත්වයේ සහ දේශපාලන ක්‍රමයේ වැදගත්කම පෙන්නුම් කරයි. එහෙයින් වාර්ගිකත්වයට ඔබ්බෙන් ඇති අනෙකුත් පසුබිම් හේතු ද විමසා බැලීම අර්ථවත් ය.

යොමුවීමේ දෙවැනි වෙනස නම් දේශපාලන සජ්ජීතවීම සලකා බැල්මයි. ජනවාර්ගිකත්වය බොහෝ විට කණ්ඩායම් අනන්‍යතාවේ කේන්ද්‍රීය සංරචකයක් වන අතර එනිසා ම එය පොදු අගතියේ බලගතු අංගයක් ද වේ. එහෙයින් විශේෂයෙන් ම යම් සමාජයක් ප්‍රධාන පෙළේ සමාජ ආර්ථික පරිවර්තනයකට ලක්වෙමින් තිබෙන විට, ජන කොට්ඨාසයක් සජ්ජිත කිරීමට උනන්දු වන දේශපාලන නායකයින්ට මෙය ඉතා පහසුවෙන් තම වාසියට යොදාගත හැකි ය. ජාතිකත්ව දේශපාලනය පෙරට එන්නේ එවැනි අවස්ථාවලදීය.

ජාතිකවාදය යනු ජාතීන් සහ රාජ්‍යයන් භෞමික වශයෙන් සර්වාංගික සම විය යුතු යයි පැවසෙන දේශපාලන මතයක් වුවත් (Gellner 1983, page 1) එය ඊටත් වඩා දුර යන්නකි. එය සමාජ, ආර්ථික සහ දේශපාලන අස්ථාවර භාවයට දක්වන සංකීර්ණ සමාජ, සංස්කෘතික, බුද්ධිමය සහ හැඟීම්බර ප්‍රතික්‍රියාවක් ලෙස එය සැලකිය හැකිය (Plameatz 1976). නූතනත්වය (Smith 1983), යටත් විජිත පාලනය ආරුඪ කිරීම (Anderson 1991; Selton-Watson 1977) හෝ රාජ්‍ය සමාජවාදය බිඳවැටීම (Smith and Osterud 1995) යනාදි හේතුවලින් මෙවැනි අස්ථාවරභාවයක් ඇති විය හැකි ය. ගෝලීයකරණය යනුවෙන් හැඳින්වෙන ක්‍රියාවලිය පිටුපස ඇති ගාමක බලවේගය වන තනි ලෝක වෙළෙඳ පළක් ඇති කිරීමෙන් ද ඒ හා සමාන අවස්ථාවර කිරීමේ බලපෑමක් ඇති වේ යැයි තර්ක කළ හැකි ය. මානවකේන්ද්‍ර වාදය සහ ජාතිකවාදය කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම පරස්පර වෙයි. එක් අතකින් එය සංස්කෘතීන් සහ ජීවන රටා සජාතීයකරණය කරන සාර්වත්‍රික දැනුමක් අවධාරණය කරන බලවේගයකි. අනෙක් අතින් ආයෝජන ප්‍රාග්ධනයේ වේගවත් ස්ථාන මාරු වීම සහ ලෝ පුරා වෙළඳපොළ එක්තැන් වීම් මගින් නව ජයග්‍රාහකයන් මෙන්ම නව පරාජිතයෝ ත් බිහි වෙති. එය සමහර ජන වර්ග සහ ජාතික කණ්ඩායම් කැබී බිඳී යාමට සහ කොන් කරනු ලැබීමට හේතුවන අතර, සංස්කෘතික සජාතීයකරණයට එරෙහි ප්‍රතික්‍රියාවකටද හේතු විය හැකිය.

මෙම විශාල සහ තිරයෙන් වැසුණු අන්ධ වූ ඓතිහාසික ක්‍රියාවලිය විසින් මුදාහරිනු ලැබිය හැකි සමාජ අස්ථාවරභාවය රටක සමාජ සහ ආර්ථික ඉහළ සමාජයේ විවිධ පිල් අතර දැඩි බල අරගල පැන නැංවීමට අවශ්‍ය තත්ත්වයන් පමණක් නිර්මාණය කරන්නේ නැත. එමගින් සාමාන්‍ය ජනතාව විශාල පිරිසක් දැඩි අනාරක්ෂිත හා අවිනිශ්චිත තත්ත්වයකට ඇද දැමිය හැකිය. පුද්ගලයින්ගේ ජීවිත කෙරෙහි එවැනි ඓතිහාසික පරිවර්තනයන්ගේ බලපෑම අවිනිශ්චිතය, බොහෝවිට විනාශකාරීය, එසේම වටහා ගැනීම දුෂ්කරය. එවැනි අවස්ථාවක කණ්ඩායම් අනන්‍යතාවය පිළිබඳ අවධාරණය බොහෝ සාමාන්‍ය මිනිසුන්ට ආකර්ෂණීය වේ; තමන්ට සිදුවන දේ ගැන කුමන හෝ අවබෝධයක් ඇති කර

ගැනීමට ඔවුනට උපකාරී වන එකම දේ එය විය හැකිය. එහෙයින් එවැනි මහා පරිමාණ වෙනසකින් හා අස්ථාවර භාවයක් වෙතින් පැන නගින ගැටුමකට අදාළ කාරණා කුමක් වුවත් එය දේශපාලන නායකයින්ට තමන්ගේ ස්ථාවර අනන්‍යතාවය, අභිමානය සහ සාධාරණත්වය සඳහා වූ සටනක් ලෙස ඉදිරිපත් කළ හැකි නම් ඔවුන් බොහෝ සාර්ථක ලෙස තම ජන කොට්ඨාස සජ්ජිත කර ගන්නට ඉඩ ඇත.

අපට මේ තර්ක පහත දැක්වෙන ආකාරයට සාරාංශ කළ හැකිය: සන්නද්ධ ගැටුමකට හේතු වන්නේ වාර්ගික වෙනස්කම් නොව, ජනවාර්ගික දේශපාලනයයි. භයානක වන්නේ දේශපාලන පක්ෂපාතීත්වය තුළට ජනවාර්ගික වෙනස්කම් එන්නත් කිරීම සහ ජනවාර්ගික අනන්‍යතා දේශපාලනීකරණය කිරීමයි.

පැරණි යුගෝස්ලෝවියාවේ කැඩීබිඳී යාම පැහැදිලි කිරීමේ දී, යුගෝස්ලොවියාව බහුවාර්ගික රාජ්‍යයක් විය යන්න පමණක් නොව, එහි වසර සියයකට වඩා පැරණි වාර්ගික ජාතිකවාදී ඉතිහාසය වෙත ආපසු හැරී බැලීම ද සලකා බැලීම වැදගත්ය. වාර්ගිකත්වය දිගු කලක් තිස්සේ දේශපාලනීකරණය වූ අතර, 1945 සිට 1980 දක්වා වූ ටිටෝගේ පාලන කාලය කාලයේ දී ද එහි වෙනසක් නොවීය. ටිටෝ යුගෝස්ලෝවියානු සමාජවාදී ෆෙඩරල් සමූහාණ්ඩුවේ සමගියට තර්ජනයක් විය හැකි ජාතිවාදී දේශපාලකයන් මර්දනය කළ ද, ඒ සමගම ව්‍යවස්ථාමය හා දේශපාලන බලය ජනවාර්ගික - ජාතික පදනමකින් බෙදා හැරියේය. රාජ්‍යය සහ පක්ෂය හැඩගැස්වුයේ මෙයයි. ටිටෝ මිය ගිය පසු ෆෙඩරල් රාජ්‍යවලින් සැදුම්ලත් සමූහාණ්ඩු හය සහ පළාත් දෙක අතර වසරෙන් වසර මාරු වූ ජනාධිපති ධූරයක් මඟින් ඔහුගේ පාලනය විස්ථාපනය කෙරිණි. ඒ අනුව, 1987 දී ජාතික වාදය යුගෝස්ලොවියාවේ ප්‍රබලතම දේශපාලන ධාරාව බවට පත්වන විට, එය අහසින් කඩා පාත් වූවක් නොවීය. එසේම උණු රිහිරිවලින් නිමැවූවක් ද නොවුයේය. එය දේශපාලන ක්‍රමයේ ඍජු නිෂ්පාදනයක් විය.



ස්ලොබොදාන් මිලොසොවිච් 1987 දී ජාතිකවාදී මතය පළ කිරීමත් සමග ඔහු පශ්චාත්-ටිටෝ කොමියුනිස්ට් නායකයා බවට පත් කළ සර්බියාවේ ජාතිකවාදයේ නව ප්‍රකාශනය ආරම්භ විය. වසර දෙකක් තුළ සර්බියානු ජාතිකවාදි දේශපාලනයට, පළමුව ස්ලොවෙනියාවෙනුත් දෙවැනිව ක්‍රොඒෂියාවෙනුත් ප්‍රතිචාර ලැබෙන්නට විය. විවිධ සමූහාණ්ඩුවල නායකත්වය ජාතිකවාදී තරගකාරීත්වය ප්‍රකාශ කරන්නට පටන් ගැනීම සමඟම, මාරුවෙන් මාරුවට ජනාධිපති පත් කිරීමේ ක්‍රමයේ උපකාරයෙන් රට කැඩීයාමේ ප්‍රවණතාව නිර්මාණය විය.

කෙසේ වුවද, ෆෙඩරල් රාජ්‍යය විනාශ කිරීම මිලොසොවිච්ගේ පරමාර්ථය නොවීය. ඔහුගේ මූලික අරමුණ වූයේ සර්බියානු පක්ෂයේ පාලනය ලබාගැනීම සඳහා බහුජන සහාය තමන්ට වාසිදායක ලෙස සජ්ජිත කර ගැනීමයි (Little and Silber 1996). ඔහු ඉතා සාර්ථක ලෙස ප්‍රයෝජනයට ගත් දුක්ගැනවිලි පිළිබඳ විධිමත් හැඟීම් ප්‍රකාශයේ පළමු අවස්ථාව වූයේ 1986 දී සර්බියානු කලා හා විද්‍යා ඇකඩමිය විසින් පළ කරන ලද පිටු 50 කින් යුත් වාර්තාමය ලියවිල්ල මගිනි. දැන් ඉතා ප්‍රකට වී ඇති මෙම ලියවිල්ල මගින් 1974 යුගෝස්ලෝවියානු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ සර්බියානු ජනතාවට ලැබුණු7 අසාධාරණ සැලකිල්ල ගැනත්, විශේෂයෙන් ම කොසෝවෝහි සර්බිවරුන්ට එරෙහි 'සමූල ඝාතන' ගැනත් උගත්තු 16 දෙනෙක් දීර්ඝ වශයෙන් මැසිවිලි නැඟුහ (Vetlesen, 2000).

දේශපාලන වශයෙන් සජ්ජිත වීම සඳහා තමන් දඩමීමා කර ගත් අප්‍රසාදය සහ අසාධාරණය පිළිබඳ හැඟීම මිලොසොවිච් විශ්වාස කළේද නැත්නම්, ඔහුට ම එය දැනුනේ ද යන්න ගැන වාද කිරීම මෙහිදී අදාළ නොවේ. පැරණි යුගෝස්ලෝවියාවේ ජාතික වාදය පෙරදැරි කර ගෙන මුලින්ම කටයුතු කළ මිලොසොවිච් හෝ දෙවැනි ව එසේ කළ ස්ලොවේනියාවේ නායක මිලාන් කුචාන් හෝ ඊට පෙර ජාතිවාදී අදහස් දැරූ බවට කිසිදු වාර්තාවක් නැත. අනෙක් අතට, ක්‍රොඒෂියාවේ ෆ්‍රැන්ජෝ ටුජ්මාන්, බොස්නියානු නායක අලියා ඉසත්බෙගොවිච් සහ කොසොවො ඇල්බේනියානුවන්ගේ නායකත්වය සඳහා තරග කළවුන්ගෙන් කිහිප දෙනෙක් ආදී සියලු දෙනාම ජාතිවාදී ප්‍රතිපත්ති ගත්තාහු ය. මේ සෑම පුද්ගලයෙකු සම්බන්ධයෙන් ම සලකා බලන විට, ඔවුන් අතර කුමන වෙනස්කම් තිබුණ ද, ඔවුන් බලයට පත්වූයේ ප්‍රධාන වශයෙන් එකම ආකාරයකිනිඃ එනම් ජාතික අසාධාරණය නැමැති තේමාව ඔස්සේ බහුජනයා සජ්ජිත කර ගැනීමෙනි. අසාධාරණය පිළිබඳ මෙම එකිනෙක පරයන මත යුගෝස්ලෝවියාව කැබලිවලට පුපුරුවා හළ පුපුරණ ද්‍රව්‍ය සංකලනයක් බවට පත්විය.

එමෙන්ම, පිටස්තර නිරීක්ෂකයෙකුට පැරණි යුගොස්ලෝවියාවේ ජනගහනයෙන් කොටසකගේ (හෝ කොටස් කිහිපයක) අසාධාරණයට ලක්වීමේ හැඟීම දැනෙන්නේ ද යන්න සැබවින් ම වැදගත් නොවේ. එසේම තම අනුගාමිකයින් ලක් වී සිටින අසාධාරණයට පිළියම් යෙදීම සඳහා එම නායකයෙකුට (හෝ නායකයින්ට) දේශපාලන වැඩපිළිවෙලක් තිබුණු බවට එම නිරීක්ෂකයා අපක්ෂපාතී විනිශ්චයක් වශයෙන් එකඟ වන්නේ ද යන්න ද වැදගත් නොවේ. වැදගත් වන්නේ ජනතාවට එය දැනෙන්නේද යන්න සහ නායකයෙකුට එයින් වාසි ගත හැකිද, ඔහු එය වාසියට ගනු ඇත්ද යන්නයි.

ඒ අනුව ජනවාර්ගික ගැටුම් යනුවෙන් හැඳින්වෙන්නේ අවසානයේ දී ජනවාර්ගික වෙස් මුහුණු පැළඳ ගන්නා වූද බලය හෝ ආර්ථික සම්පත් (මෙහිදී සාකච්ඡා නොකෙරුණු සමහර විටෙක පාරිසරික සම්පත් ඇතුළු) අත්පත් කර ගැනීමේ මාර්ග සඳහා වූ ද ගැටුම්ය. ජනවාර්ගික වෙනස්කම් කේන්ද්‍රීය වශයෙන් වැදගත් වන්නේ සන්නද්ධ ගැටුමේ එකම හේතුව වශයෙන් නොව දේශපාලන නායකයින් ජනතාව සජ්ජිත කිරීම සඳහා යොදන මෙවලමක් වශයෙනි. ඒ අනුව ජනවාර්ගික වෙනස්කමට විවරණයේ දී වැදගත් ස්ථානයක් හිමිවන නමුත් එයට ප්‍රධානත්වය හිමි නොවිය යුතුය.



දේශපාලන මෙහෙයවීම සඳහා වූ මෙම විශේෂිත උපක්‍රමය වෙතට අවධානය යොමු කිරීම පිණිස ජනවාර්ගික වෙස් මුහුණ නැමැති මෙම රූපකය යොදාගැනීම, සන්නද්ධ ගැටුම්වල ඇතුළතින් හෝ බැහැරින් ඇති යථාර්ථය හෝ අනන්‍යතා හැඟීමේ වැදගත්කම ලඝු කොට සැලකීමට දරන උත්සාහයක් ලෙස වැරදි අර්ථකථනයක් නො කළ යුතු ය. උදාහරණ වශයෙන් 1990 ගණන්වල ඇති වූ රුසියානු-චෙචෙන් යුද්ධ චෙචෙන් පාර්ශවයෙන් ජනවාර්ගික අනන්‍යතාවය පිළිබඳ ගැඹුරු පැහැදිලි හා කටුක හැඟීමකින් ද, ඔවුනට එරෙහි පුළුල් ලෙස පැතිරුණු රුසියානු වර්ගවාදයකින් ද යුක්ත වූ බැව් නිසැකය. වසර 200 කට වැඩි කාලයක් පුරා චෙචෙන් ව්‍යාපාර රුසියානු පාලනයට එරෙහි විය. එසේ වුවද, ජනවාර්ගික සංසිද්ධියක් ලෙස සරලව විග්‍රහ කළහොත් රුසියාව සහ චෙච්නියාව අතර ගැටුම නිසි ලෙස අවබෝධ කරගත හැකි නොවේ.

මෙම ගැටුම හා යුගෝස්ලෝවියාව බිඳීයාම අතර වැදගත් සමානකම් ඇත. 1994 දී චෙච්නියාව සහ රුසියාව අතර තත්ත්වය යුද්ධය දක්වා වර්ධනයවීම පිළිබඳ විග්‍රහයේ වැදගත් අංගයක් වන්නේ නව

සහ පැරණි දේශපාලන ප්‍රභූන් අතර බලය සඳහා පැවති අරගලයයි. 1991 අගෝස්තු - සැප්තැම්බර් මාසවලදී ජෙනරාල් සොකාර් ඩුඩායෙව් සහ ඔහුගේ සගයන් චෙච්නියාවේ බලය අල්ලා ගැනීමේ දී එය ප්‍රධාන සාධකයක් විය (Tishkov 1997, පිටු 200- 206). එක්තරා දුරකට දෙපැත්තේම ආණ්ඩුවේ අඩුපාඩුකම් නිසාත් (Lieven 1998, පිටු 80-84, 94-96), එක්තරා දුරකට චෙච්නියාවේ (Tishkov 1997, පිටු 216-218) සහ මොස්කව් (Shapiro 1995) අතර බලය සඳහා තරගකරුවන් සිය උපක්‍රම ක්‍රියාත්මක කිරීම නිසාත්, 1994 දෙවැනි භාගයේ දී චෙච්නියාවේ සහ රුසියාවේ නායකයින්ට ඔවුන්ගේ මතභේද පූර්ණ යුද්ධයක් දක්වා වර්ධනය වීම වළක්වා ගැනීමට නොහැකි වූ බව පෙනේ.

ඛේදවාචකය වන්නේ, වාර්ගික වෙස් මුහුණ පැළඳ ගත් පසු එය ඉවත් කිරීම අතිශයින් දුෂ්කර වීමයි. විශේෂයෙන් ම අර්බුද හා යුද්ධ ඇති විටෙක, විරෝධය හා දුක්ගැනවිලි වටා නැඟී එන කණ්ඩායම් අනන්‍යතා හැඟීම් ඒකරාශී වූ විට, දිග්ගැස්සුනු චක්‍රීය ගැටුම්වල දී එයට සමනය කළ නොහැකි වෛරයක් ඇති කළ හැකි වීමයි.

මේ පිළිබඳ ප්‍රධාන සමකාලීන උදාහරණය දැකිය හැක්කේ බුරුණ්ඩියේ සහ රුවන්ඩාවේ හුටු/ටුට්සි එදිරිවාදිකම් තුළ ය. ඒවා මතකයෙන් ඈත අතීතය දක්වා දිව යන්නේ නැත. මෙම කණ්ඩායම් දෙක වෙනස් ලෙස නිර්වචනය කොට එක් කණ්ඩායමකට අවාසි ලෙස අනෙක් කණ්ඩායමට වාසි සලසා දුන්නේ යටත් විජිත පාලකයින්ය. විරෝධතාව පැන නැංගේ මෙයිනි. නිදහස ලැබූ මොහොතේ සිට දේශපාලන නායකයෝ බලය පවත්වා ගැනීම සඳහා හෝ බලයට අභියෝග කිරීම සඳහා මෙම කණ්ඩායම් දුක්ගැනවිලි ක්‍රමානුකූලව ප්‍රයෝජනයට ගන්නා අතර එමගින් හතළිස් වසරක යුද්ධ සහ සමූහ ඝාතන ද පවත්වාගෙන යති (Copson 1994). ශ්‍රී ලංකාවේද නිදහසින් පසු දුක් ගැනවිලි පිළිබඳ සාපේක්ෂ හැඟීම් දිග්ගැස්සුණු සිවිල් යුද්ධයකට මග පෑදූ විට මේ ආකාරයටම සිංහල/දෙමළ ගැටුම් පැන නැඟුණි (Uyangoda 1996).



මෙම ගැටුම්වලට මග පෑදූ ජනයා සජ්ජිත කිරීමේ ක්‍රියාවලියේ දී යළි යළිත් නිරීක්ෂණය කළ හැකි මූලික කාරණයක් නම් එක් පාර්ශවයක හෝ පාර්ශව දෙකේම අය සියපරමාර්ථ වෙනුවෙන් පළ කළ උද්‍යෝගිමත් බහුජන සහයෝගීතාවයයි. පරමාර්ථය පිළිබඳ මෙම විශ්වාසය යනු එහි නිවැරදි බව සහ සාධාරණ බව පිළිබඳ විශ්වාසයයි. 1998 සහ 1999 යුද්ධයට පෙර, කොසෝවෝහි සර්බිවරු සහ ඇල්බේනියානුවෝ තමන් මුහුණ දෙන බව හැඟුණු අසාධාරණයන්ට දැඩි සේ විරුද්ධ වූහ. බුරුණ්ඩි සහ රුවන්ඩා යන රටවල් දෙකේම හුටු සහ ටුට්සි යන දෙපාර්ශවයන්ටම තමන්ට අනෙක් පාර්ශවය කළ අසාධාරණකම් ගැන හද කකියන ආකාරයෙන් කතා කළ හැකිය. ශ්‍රී ලංකාවේ සිංහලයින්ට සහ දමිළයින්ට ද එකිනෙකාගෙන් වූ විරසකකම් ගැන කියා පෑ හැකිය. අද බොහෝ සන්නද්ධ ගැටුම්වලදී එක් පාර්ශ්වයක හෝ පාර්ශව දෙකේම උපක්‍රමය සහ උපාය මාර්ගය වී ඇත්තේ සෘජුවම සිවිල් වැසියන්ට පහරදීමයි. බොස්නියා - හර්සගොවිනාවේ සහ රුවණ්ඩාවේ වාර්ගික පාවිත්‍රීකරණය, සමූහ ඝාතනය සහ සංවිධානාත්මක ස්ත්‍රී - දූෂණය, චෙච්නියාවේ සිවිල් වැසියන් සිටින ප්‍රදේශවලට බෝම්බ හෙළීම උදාහරණයි. මේ බියකරු සිදුවීම් පිළිබඳ කටුක මතකය කණ්ඩායම් අනන්‍යතා හැඟීමක් සදාකාලික ලෙස ගොඩනගන අතර එය ඊළඟ වටයේ ජනයා සජ්ජිත කර ගැනීම සඳහා සාරවත් බිමක් සකස් කරදෙයි.

## 8. නිගමනය

සන්නද්ධ ගැටුම්වල හේතු පිළිබඳව දූන් වැදගත්, ප්‍රයෝජනවත් සහ වර්ධනය වන සාහිත්‍ය සමුච්චයක් ඇත. මෙම සාහිත්‍යය දුර්වල ආර්ථික තත්ත්වයන්, දේශපාලන අවස්ථා හිඟ බව සහ පාරිසරික හානිය ආදියට අදාළ ප්‍රධාන කරුණු කෙරෙහි අපගේ අවධානය යොමු කරවන අතර, වාර්ගික විවිධත්වය සන්නද්ධ ගැටුමේ හේතුවක් ලෙස නොසලකන ලෙස අපට අනතුරු අඟවන නිසා එම සාහිත්‍යයෙහි න්‍යායාත්මක නිගමන සීමිත වුවත් වැදගත්ය.

මෙම පර්යේෂණය මෙතෙක් වත්මන් සන්නද්ධ ගැටුම් පිටුපස පොදුවේ ඇති දීර්ඝකාලීන සමාජ ආර්ථික සහ දේශපාලන තත්ත්වයන් කෙරෙහි මූලික වශයෙන් සැලකිල්ල යොමු කරයි. විශේෂිත සන්නද්ධ ගැටුමක් විශ්ලේෂණය කිරීමේ දායකත්වයක් වශයෙන් සැලකීමේ දී, මෙම දීර්ඝ කාලීන පසුබිම් තත්ත්වයන්, ඕනෑම ප්‍රත්‍යෙක අධ්‍යයනයක් විසින් ඉස්මතු කොට දක්වෙන කෙටි කාලීන කාරණා සමග සම්බන්ධ කිරීමට ක්‍රමයක් ද අප සොයාගත යුතුය.

මෙබඳු සම්බන්ධයක් ගොඩනැංවීමේ සාපේක්ෂ ක්‍රම දෙකක් වෙත මෙම ලිපියෙන් අපි අවධානය යොමු කළෙමු. පළමුවැන්න න්‍යායයික සහ අනුභූතික කාරණා යන දෙකම සංවිධානය කිරීමටත් එමගින් විශ්ලේෂණය පහසු කිරීමටත් උපකාරී වන ක්‍රමවේදයකි. දෙවැන්න දීර්ඝකාලීන සහ කෙටි කාලීන කරුණු බද්ධ කරන යුගල සංකල්පයකි. එනම් සාධාරණත්වය සහ (ජනයා) සජ්ජීත කිරීම පිළිබඳ සංකල්පයි. ලෝකය සහ එහි රටවල් සමාජමය වශයෙන් සහ ආර්ථික වශයෙන් අසාධාරණ අයුරින් ව්‍යුහගත කරනු ලැබ ඇත්තේ නම්, එම අසාධාරණය අත්විඳින ජනතාවක් සහ එය වාසියට හරවාගෙන සිය බලය ස්ථාවර කරගත හැකි නායකයෝ ද සැමවිට ම සිටිති. ඒ අනුව ගැටුම් විශ්ලේෂණය සඳහා සහ සාමය සඳහා 'සාධාරණත්වය' ප්‍රධාන කාරණයක් වේ.



## 9. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියවීම්


Adelman, Howard and Astri Suhrke 1996. "Early Warning and Conflict Management," in Joint Evaluation of Emergency Assistance to Rwanda, *The International Response to Conflict and Genocide: Lessons from the Rwanda Experience*, Copenhagen: DANIDA.

Anderson, Benedict 1991. *Imagined Communities*, London: Verso.

Auvinen, Juha 1997. "Political Conflict in Less Developed Countries 198–89," *Journal of Peace Research*, 34, 2, 177–195.

Avery, William P, and David P. Rapkin 1986. "World Markets and Political Instability within Less Developed Countries," *Cooperation and Conflict*, 21, 2, 99–117.

Calhoun, Craig 1997. *Nationalism*, Buckingham: Open University Press.

Chan, Steve 1997. "In Search of Democratic Peace: Problems and Promise," *Mershon International Studies Review*, 41 (Supplement 1), 59–91.

Clausewitz, Carl von 1832/1976. *On War* (Translated by Howard, Michael and Peter Paret), Princeton, NJ: Princeton University Press.

Collier, Paul 1999. "Doing Well out of War," Paper prepared for Conference on Economic Agendas in Civil Wars, London, April 26–27, 1999.

Collier, Paul, and Anke Hoeffler 1999. *Justice-Seeking and Loot-Seeking in Civil War*, Washington, DC: The World Bank/CSAE.

Copson, Raymond W. 1994. *Africa's Wars and Prospects for Peace,* New York: M.E. Sharpe.
Dessler, David 1994. "How to Sort Causes in the Study of Environmental Change and Violent Conflict," *in* Græger and Smith, op. cit.
Gellner, Ernest 1983. *Nations and Nationalism*, Oxford: Blackwell.
Gleditsch, Nils Petter (ed.) 1997. *Conflict and the Environment*, Dordrecht: Kluwer Academic.
Gleditsch, Nils Petter 1998. "Armed Conflict and the Environment: A Critique of the Literature," *Journal of Peace Research*, 35, 3, 381–400.
v. d. Goor, L., K. Rupesinghe and P. Sciarone (eds.) 1996. *Between Development and Destruction: An Enquiry into the Causes of Conflict in Post-Colonial States*, The Hague: Netherlands Ministry of Foreign Affairs/The Netherlands Insititute of International Relations.
Græger, N and D. Smith (eds.) 1994. *Environment, Poverty, Conflict*, Oslo: International Peace Research Institute.
Gurr, Ted Robert 1970. *Why Men Rebel*, Princeton, NJ: Princeton University Press.
Gurr, Ted Robert 1995. *Minorities at risk: a global view of ethnopolitical conflicts*, Washington, D.C.: United States Institute of Peace Press.
Hauge, Wenche, and Tanja Ellingsen 1998. "Beyond Environmental Scarcity: Causal Pathways to Conflict,"*Journal of Peace Research*, 35, 3, 299–317.
Hegre, Håvard, Scott Gates and Nils Petter Gleditsch 1999. *Estimating the Relative Risk of Civil War* (unpublished paper, International Peace Research Institute, Oslo).
Homer-Dixon, Thomas 1994. "Environmental Scarcities and Violent Conflict: Evidence from Cases," *International Security*, 19, 1, 5–40.
Homer-Dixon, Thomas 1999. *Environment, scarcity and violence*, Princeton, NJ: Princeton University Press.



Horowitz, David 1985. *Ethnic Groups in Conflict*, Berkeley, Ca: University of California Press.
International Commission on the Balkans 1996. *Unfinished Peace*, Washington, DC: Carnegie Endowment for Peace.
Jaggers, Keith, and Ted Robert Gurr 1995. "Tracking Democracy's Third Wave with the Polity III Data,"*Journal of Peace Research*, 32, 4, 469–482.
Judah, Tim 1997. *The Serbs: History, Myth and the Destruction of Yugoslavia*, New Haven, Conn: Yale University Press.
Judah, Tim 1999. "Kosovo's Road to War," *Survival*, 41, 2, 5–18.
Kamenka, E. (ed.) 1976. *Nationalism: The Nature and Evolution of an Idea*, London: Edward Arnold.
Kaufman, Chaim 1996. "Possible and Impossible Solutions to Ethnic Civil Wars," *International Security*, 20, 4, 136–175.
Keegan, John 1994. *A History of Warfare,* New York, NY: Random House/Vintage.
Levy, Jack S. 1989. "The Causes of War: A Review Of Theories And Evidence," in Philip E. Tetlock et al. (eds.) *Behavior, Society, and Nuclear War. Vol. 1,* New York: Oxford University Press, 209-333.
Lieven, Anatol 1998. *Chechnya, Tombstone of Russian Power,* London, New Haven, Conn: Yale University Press.
Lipschutz, Ronnie D. 1997. "Environmental Conflict and Environmental Determinism: The Relative Importance of Social and Natural Factors," *in* Gleditsch, op. cit.
Little, Alan and Laura Silber 1995. *Yugoslavia: Death of a Nation*, New York, NY: Penguin Books.
MacMillan, John 1996. "Democracies don't fight: a case of the wrong research agenda?" *Review of International Studies*, 22, 3, 275–299.
Plamenatz, John 1976. "Two Types of Nationalism," *in* Kamenka, op. cit.

Rapoport, Anatol 1989. *The Origins of Violence: Approaches to the Study of Conflict*, New York, NY: Paragon House.
Risse-Kappen, Thomas 1995. "Democratic Peace – Warlike Democracies? A Social Constructivist Interpretation of the Liberal Argument," *European Journal of International Relations*, 1, 4, 491-517.
Rummel, R.J. 1995. "Democracies ARE Less Warlike Than Other Regimes," *European Journal of International Relations*, 1, 4, 457–479.
Rupesinghe, K. and K. Mumtaz (eds.) 1996. *Internal Conflicts in South Asia*, London: Sage.
Russett, Bruce 1993. *Grasping the Democratic Peace*, Princeton, NJ: Princeton University Press.
Seton-Watson, Hugh 1977. *Nations and States. An inquiry into the origins of nations and the politics of nationalism*, London: Methuen.
Shapiro, Margaret 1995. "Return of the Apparatchiks," *International Herald Tribune*, 16 January.
Singer, David 1996. "Armed Conflict in the Former Colonial Regions: From Classification to Explanation," *in* v. d. Goor et. al., op. cit.
Smith, Anthony D. 1983. *Theories of Nationalism*, 2nd ed., London: Duckworth.
Smith, Dan 1997. *The State of War and Peace Atlas*, London & New York, NY: Penguin Books.
Smith, Dan and Øyvind Østerud 1995. *Nation-State, Nationalism and Political Identity*, Oslo: University of Oslo.
Starr, Harvey 1997. "Democracy and Integration: Why Democracies Don‘t Fight Each Other," *Journal of Peace Research*, 34, 2, 153–162.
Taber, Robert 1970. *The War of the Flea: A Study of Guerrilla Warfare Theory and Practice*, St. Albans: Paladin.
Tishkov, Valery 1997. *Ethnicity, Nationalism and Conflict in and after the Soviet Union*, London: Sage.
Uyangoda, Jayadeva 1996. "Militarization, Violent State, Violent Society: Sri Lanka," *in* Rupesinghe, op. cit.
Vasquez, John A. 1987. "The Steps to War: Toward a Scientific Explanation of Correlates of War Findings," *World Politics*, XL (October), 108–145.
Vetlesen, Arne Johan 2000. "Genocide: A Case for the Responsibility of the Bystander," *Journal of Peace Research*, 37, 4, 519-532.
Wallensteen, Peter and Margareta Sollenberg 1996. "The End of International War? Armed Conflict 1989-95," *Journal of Peace Research*, 33, 3, 353–370.
Wallensteen, Peter and Margareta Sollenberg 1997. "Armed Conflicts, Conflict Termination and Peace Agreements, 1989-96, " *Journal of Peace Research*, 34, 3, 339–358.
Wallensteen, Peter and Margareta Sollenberg 1998. "Armed Conflict and Regional Conflict Complexes, 1989-97," *Journal of Peace Research*, 35, 5, 621–634.
Wallensteen, Peter and Margareta Sollenberg 1999. "Armed Conflict, 1989-98," *Journal of Peace Research*, 36, 5, 593–606.
Wallenstein, Peter and Margareta Sollenberg 2000. "Armed Conflict, 1989-1999," *Journal of Peace Research*, 37, 5, 635–649.
Welch, David 1993. *Justice and the Genesis of War*, Cambridge: Cambridge University Press.